# බලන්ගොඩ නගර සභාව

## 2022-01-11 වන දිනැති මහා සභා රැස්වීම් වාර්තාව

**ස්ථානය - බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව**

**දිනය - 2022.01.11**

**වේලාව - පෙ.ව. 10.00**

**බලන්ගොඩ නගර සභාවේ ගරු සභාපති චමික ජයමිණි විමලසේන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් මෙදින මහ සභාවේ කටයුතු පවත්වන ලදී.**

**සහභාගීත්වය**

1. ගරු සභාපති — චමික ජයමිණි විමලසේන මැතිතුමා
2. ගරු නාගරික මන්ත්‍රී — ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා
3. ගරු නාගරික මන්ත්‍රී — ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා
4. ගරු නාගරික මන්ත්‍රී — ඩබ්.ඒ.ඩබ්.පී.ගුණරත්න මැතිතුමා
5. ගරු නාගරික මන්ත්‍රී — එම්. ජුනයිදීන් මලික්ෂා මැතිතුමා
6. ගරු නාගරික මන්ත්‍රී — එම්. නිමල් කරුණාරත්න මැතිතුමා
7. ගරු නාගරික මන්ත්‍රී — නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා
8. ගරු නාගරික මන්ත්‍රිනි — ජී. චන්ද්‍රලතා මැතිතුමිය
9. ගරු නාගරික මන්ත්‍රී — එම්.එස්.පී.ගලප්පත්ති මැතිතුමා
10. ගරු නාගරික මන්ත්‍රී — එම්. ඩබ්. විමලසිරි මැතිතුමා
11. ගරු නාගරික මන්ත්‍රී — රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා
12. ගරු නාගරික මන්ත්‍රිනි — පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය
13. ගරු නාගරික මන්ත්‍රිනී — සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය
14. ගරු නාගරික මන්ත්‍රිනි — එම්. ශාන්තිලේඛා මැතිතුමිය
15. ගරු නාගරික මන්ත්‍රී — කේ. ජී. පේමදාස මැතිතුමා
16. ගරු නාගරික මන්ත්‍රිනී — මංගලිකා ඉලංකෝන් මැතිතුමිය

**නිලධාරි සහභාගීත්වය**

1. ලේකම් එස්.එච්.ඒ.කරුණාරත්න මිය

**01. පසුගිය සභාවේ මහා සභා වාර්තාව, (2021-12-06, 2021-12-14, 2021.12.29 හා 2021.12.31 යන දිනයන්හි විශේෂ මහ සභා වාර්තා සභා සම්මත කිරීම.**

මෙදින මහ සභාවේ වැඩ කටයුතු ආරම්භ කළ ගරු සභාපතිතුමා, සභාව සඳහා සහභාගි වූ ගරු මන්ත්‍රී මණ්ඩලය, ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලය හා මාධ්‍යවේදීන් ඇතුළු සියළුදෙනා පිළිගත් අතර, ආගම සිහි කිරීමෙන් අනතුරුව 2021-12-09 දින පැවති මහ සභාවේ සභා වාර්තාව, 2021-12-06 දින, 2021-12-14 දින, 2021-12-29 දින හා 2021-12-31 දින පැවති විශේෂ මහ සභා වාර්තා සංශෝධනයන්ට යටත්ව සත්‍යය වාර්තාවක් බවට සභා සම්මත කර ගන්නා ලෙස පවසා සිටින ලදී.

එහිදී ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය විසින් 2021-12-09 දින පැවති මහ සභාවේ සභා වාර්තාව, 2021-12-06 දින, 2021-12-14 දින, 2021-12-29 දින හා 2021-12-31 දින පැවති විශේෂ මහ සභා වාර්තා සංශෝධනයන්ට යටත්ව සත්‍යය වාර්තාවක් බවට යෝජනා කළ අතර ගරු නාගරික මන්ත්‍රී එම්. ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී ගරු සභාපතිතුමා විසින් මෙදින සභා වාර්තාවේ සංශෝධනයන් තිබේදැයි විමසූ අතර, ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා පැවසූවේ 2021-12-14 සහ 2021-12-31 දින පැවති අයවැය සම්බන්ධ විශේෂ වාර්තා අසත්‍ය වාර්තා බවට යෝජනා කරමින් ඒ සඳහා බෙදීමක් අවශ්‍ය බවට යෝජනා කළ අතර, එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා, 2021-12-14 සහ 2021-12-31 දින පැවති වාර්තාවන් තුල ගරු මන්ත්‍රීවරු සිදු කළ ප්‍රකාශයන් අන්තර්ගත වී නැද්දැයි හොඳින් අධ්‍යයනය කර යෝජනා ස්ථිර කළේදැයි විමසන ලදී.

මෙහි දී ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ. ප්‍රේමකුමාර මැතිතුමා පැවසූවේ ගරු නාගරික මන්ත්‍රීතුමා අදහස් කළේ අද දින සභාව පවත්වාගෙන යාමට නීතිමය වශයෙන් බලයක් නොමැති බවත්, ගරු සභාපතිවරයාව නොපිළිගන්නා බැවින් එතුමාට සභාව මෙහෙයවිය නොහැකි බවත් ය.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් සංයමයකින් යුතුව කරුණු ඉදිරිපත් කිරීම සම්බන්ධව සතුටු වන නමුත් අවුරුදු 25ක් -30 ක් පමණ කාලයක් මෙම සභාවේ නියෝජනය කරනවැයි පවසන ගරු මන්ත්‍රීවරුන් අයවැය සම්මත නැති බව පැවසුවද තමන් අයවැය සම්මත බව පවසන බව ද ගරු මන්ත්‍රීවරුන්ට එය තීරණය කළ නොහැකි අතර, පළාත් පාලන කොමසාරිස්තුමා හෝ ගරු ආණ්ඩුකාරතුමා නීත්‍යානුකූලව ලිඛිත ලිපියක් එවා හෝ ගැසට් කර තිබිය යුතු බව ද පැවසීය.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.ඩබ්.පී. ගුණරත්න මැතිතුමා අදහස් දක්වමින් ගරු සභාපතිතුමාට තේරෙන පරිදි එසේ පැවසුව ද තමන්ට හා ගරු මන්ත්‍රීවරුන්ට තේරෙන ලෙස අයවැය පරාද බවට මන්ත්‍රීවරුන් දස දෙනෙකුගේ අත්සනින් ලිඛිතව ලිපියක් උපදෙස් ඉල්ලමින් පළාත් පාලන කොමසාරිස්තුමාට ලබා දුන් බව ද අයවැය පරාදයි නම් සති දෙකක් ඇතුලත දෙවනි වර අයවැය ඉදිරිපත් කළ යුතු බව ද ඉන්පසුව

නීත්‍යානුකූලව නව සභාවක් පැවැත්විය හැකි නමුත් ඊට පෙර සභාව කැඳවීම නීත්‍යානුකූල නොවන බව ද ගරු සභාපතිතුමාට බලෙන් සිටීමට අවශ්‍ය නම් කළ යුතු දෙයක් නොමැති නමුත් අනීතික ලෙස වැඩ කිරීමට අපට නොහැකි බව ද මෙම සතිය ඇතුලත අයවැය සම්බන්ධ තීරණයක් කොමසාරිස්තුමාගෙන් ලැබෙන අතර, ඒ අනුව අයවැය පරාජය වී නොමැති නම් ගරු සභාපතිතුමාට සභාපති ධූරයේ සිටිය හැකි බව ද පරාජය වී නම් දෙවන වර අය වැය ඉදිරිපත් කළ යුතු බව ද එය ඉදිරිපත් කිරීම නොකිරීම ඔබතුමාගේ අයිතියක් බව ද අපගේ අයිතිය මෙසේ පවසන බව ද අද දින න්‍යාය පත්‍රයේ ඉතිරි සියල්ලම ප්‍රතික්ෂේප කිරීමක් නොව අවශ්‍ය උපදෙස් ලැබුණු පසු සභාව නීත්‍යානුකූලව පවත්වන ලෙස ද පැවසීය.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා අදහස් දක්වමින් තමන් ලිඛිතව දැනුම් දීමක් එවා තිබුණු අතර, එය සහ කල් දී ඇති ප්‍රශ්නය ඇතුලත් කර නොමැති බව ද අද දින අනුමැතිය ලබා දෙන්නේ නම් ලබා දෙනු ලබන්නේ කසළ කළමනාකරණය හා රජයේ සේවක වැටුප් ගෙවීම සඳහා පමණක් වන අතර, අතිකාල, බටා සඳහා අනුමැතිය මෙන්ම ට්‍රැක්ටර් රථ හැර අනිකුත් වාහන සඳහා ඉන්ධන වෙනුවෙන් අනුමැතිය ලබා නොදෙන බව ද අයවැය පරාද වූ බව ද පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ජී.ඩබ්.පී. ගුණරත්න මැතිතුමා පැවසුවේ පළාත් පාලන කොමසාරිස්තුමා හට කතා කළ බවත්, අද දින සභාව වර්ජනය කිරීමට හැකිව තිබුණු නමුත් එසේ නොකර අපගේ විරෝධය සභාවට ප්‍රකාශ කිරීමට අද දින පැමිණි බවත් ය.

මෙහි දී ගරු සභාපතිතුමා අදහස් දක්වමින් තමන්ට බලයේ රැඳී සිටීමට කිසිම අවශ්‍යතාවයක් නොමැති අතර, මෙහි සිටීම තුළ තමන්ගේ ව්‍යාපාර ඇතුළු සියලුම කටයුතුවලට පාඩුවක් වන බව හැමදෙනාම දන්නා බව ද තමන් කිසිවිටක අනීතික කටයුතුවලට අනුබල නොදෙන බව ද පළාත් පාලන කොමසාරිස්තුමා කතා කළ බව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ජී.ඩබ්.පී. ගුණරත්න මැතිතුමා පැවසූ අතර, එතුමා පළාත් පාලනයට පැමිණ වසර දෙකක් වැනි කාලයක් වන බව ද එබැවින් පළාත් පාලනයේ ළඳරුවෙක් බව ද තමන් අද පළාත් පාලන නීතිය සම්බන්ධව වැඩි අවබෝධයක් ලබා ගෙන ඇත්තේ ගරු නාගරික මන්ත්‍රීවරුන් විසින් ලබා දෙන පන්නරය නිසා බව ද ඒ සම්බන්ධව හා අද දින සභාවට පැමිණීම සම්බන්ධව ස්තුතිවන්ත වන බව ද අද දින පැමිණීම විරෝධය පළකිරීමක් නොව සහයෝගය ලබා දීමක් බව ද කොසොල් රජතුමාගේ සිහින 16 සැබෑවෙමින් පවතින අතර, එය ලංකා සමාජය හා දේශපාලනය තුළ අත් විඳිමින් තිබෙන බව ද අද වන විට මුළු රටම සම්පූර්ණයෙන් රජය විවේචනය කරමින් රජය ප්‍රතික්ෂේප කරන සහ ජනතාව වෙනත් විකල්ප රටේ බලාත්මක කිරීම සඳහා මැතිවරණයක් බලාපොරොත්තු වන කාලයක ජන මතයට විරුද්ධව යාමක් සභාව තුළ දකින්නට ලැබෙන බව ද පැවසීය.

එමෙන්ම ගරු නාගරික මන්ත්‍රීවරුන් පිරිසක් පවසන පරිදි කොමසාරිස්තුමා උපදෙස් ලබා දෙන්නේ මෙම සභාව සම්පූර්ණයෙන්ම කඩාකප්පල් වී ඇති ලෙස වුව ද පළාත් පාලන පනත සහ 2012 අංක 21 දරණ පනතේ 178 සංශෝධනය වූ වගන්තිය අනුව පනතෙහි නීත්‍යානුකූල තත්ත්වය පෙන්වා දී නැති බව ද ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමා සහ ගරු ආණ්ඩුකාරවරයා සන්තර්පණය කිරීමට අවශ්‍ය කාරණා පමණක් තමන් සිතන ආකාරයට කොමසාරිස්තුමා ලබා දෙන බව ද පැවසූ ගරු සභාපතිතුමා, මෙය ප්‍රජාතන්ත්‍රවාදයට හා ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවට කරනු ලබන විශාලම හානියක් බව ද තව සතියකින් පිළිතුරක් ලබා දෙන ලෙස කොමසාරිස්තුමා පවසන්නේ නම් එතුමාට තමන් හට ලිපියක් යොමු කළ හැකි බව ද පසුගිය වර්ෂයේ අවසන් මාසික සභාවේ දී සෑම මසකම දෙවන අඟහරුවාදා මාසික මහ සභාව

පැවැත්වීමට ඒකමතිකව සම්මත වූ අතර, එම සභා වාර්තාව සංශෝධන නොමැතිව සභාවේ සම්මත වූ බවද ඒ අනුව නීත්‍යානුකූලව සභාව අද දින කැඳ වූ බව ද නීත්‍යානුකූල ලියවිල්ලක් නොමැතිව අයවැය පරාජය වූ බව හා සභාව පැවැත්වීමට නීත්‍යානුකූල බලයක් නොමැති බවට කරනු ලබන ප්‍රකාශයන් තමන් පිළි නොගන්නා බව ද 2021 වර්ෂයේ අයවැය සම්මත නොවූ බව පවසමින් මෙවැනිම ආකාරයෙන් හැසිරුණ ද එයට සාධාරණ මතයක් ලැබුණු නමුත් අද වන තුරු එම මතය සබරගමුව පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් වාචිකව පැවසුව ද ලිඛිතව ලබා දී නොමැති බව ද දේශපාලන වංචාවක් පවතින බව ද පවසන ලදී.

ඒ අනුව එම වර්ෂයේ ජනතාවට අවශ්‍ය කරන මිලියන 40-50 ක් පමණ වන සේවා පහසුකම් අහිමි වූ බව ද මෙම වර්ෂය ආරම්භයේ දීම න්‍යාය පත්‍රයට ඇතුලත් කර තිබෙන්නේ අප කාගේවත් පුද්ගලික කාර්යයන් නොව බළන්ගොඩ නගර සභාවේ බදු ගෙවන ජනතාව වෙනුවෙන් සිදු කිරීමට බැඳී සිටින සේවා හා පහසුකම් බව ද එම නිසා මහජනතාව වෙනුවෙන් නොකළ යුතුයි පවසන දේ තිබේනම් එම දේවල්වලට කැමැත්ත අකමැත්ත ලබා දෙන ලෙස ද අවශ්‍ය නම් බෙදීම් සඳහා යා හැකි බව ද අද දිනයේ බළන්ගොඩ බදු ගෙවන ජනතාව වෙනුවෙන් 2022 වර්ෂයට අවශ්‍ය කරන මූලික සැලැස්ම අනුමත කිරීමට අවශ්‍ය සහයෝගය ලබා දෙන ලෙස ද පැවසීය.

ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා අදහස් දක්වමින් ගරු සභාපතිතුමා නීත්‍යානුකූල සභාපතිවරයා වශයෙන් පසුගිය වර්ෂ 03 -04 තුල පිළිගත් අතර, එම කාලය ඇතුලත සිදු කළ යහපත් ක්‍රියාවන්වලට සහයෝගය ලබා දුන් බව ද කඩාකප්පල් නොකළ බව ද නගරයේ ජනතාව වෙනුවෙන් ගරු සභාපතිතුමා සහ නාගරික මන්ත්‍රීවරුන් ගෙනෙන ලද යෝජනාවන්ට සහය දුන් බව ද මෙවර අයවැයේ දී අයවැය පරාජය වූ බැවින් සභාව මෙහෙය වීම නීත්‍යානුකූල නොවන බව අපගේ හැඟීම බව ද කොමසාරිස්තුමා වෙත අවශ්‍ය කටයුතු සඳහා යොමු කර ඇති අතර, මෙම මාසයේ වාර්තාව ලැබුණු පසු සභාවේ කටයුතු සිදු කරගෙන යා හැකි බව ද පැවසීය.

එමෙන්ම රජය අපහසුතාවයට, අප්‍රසාදයකට පත්ව ඇති බව ඔබතුමා පැවසුව ද සෑම රජයක්ම පත්වී කාලයක් යාමේ දී අප්‍රසාදයට පත් වන බව ද පැවති රජය ඡන්ද පැවැත්වූයේ හෝ ඉල්ලා අස් වූයේ නැති බව ද ගරු ජනාධිපති රණසිංහ ප්‍රේමදාස මැතිතුමා ජනාධිපතිව සිටි කාලයේ දී අප්‍රසාදයක් පැවති බව ද පවසන ලදී.

අනතුරුව සභාවේ කෑ කෝ ගැසීමක් ඇති විය.

නැවතත් ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා අවුරුදු 05 කින් පවත්වන ඡන්ද විමසීමේ දී අවශ්‍ය නැතිනම් ජනතාව විසින් රජය ප්‍රතික්ෂේප කළ හැකි බව ද කොසොල් රජතුමාගේ සිහින ගැන කතා කිරීමේ දී එම සිහින සැබෑ වූයේ බුදු හාමුදුරුවන්ගේ කාලයේ පටන් බව ද අතීතයේ වර්තමානයේ පමණක් නොව අනාගතයේ දී ද සිදු වන බව ද එබැවින් මෙය ප්‍රතික්ෂේප කරන බව ද පැවසීය.

**02. ගරු සභාපතිතුමන් විසින් කරනු ලබන නිවේදන**

- අසනීප තත්ත්වයක් හේතුවෙන් 2022-01-11 වන දින මහ සභාවට සහභාගී නොවන බැවින් නිවාඩු අනුමත කර දෙන ලෙස ගරු උප සභාපති එම්.ටී.එම්.රුමී මැතිතුමා විසින් කරන ලද ඉල්ලීම ගරු සභාපතිතුමන් විසින් ඉදිරිපත් කරන ලදුව නිවාඩු අනුමත කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.ඩබ්.පී. ගුණරත්න මැතිතුමා පැවසුවේ මෙම සභාව ප්‍රතික්ෂේප කරමින් යෝජනාවක් හා බෙදීමක් ඉල්ලූ අතර, එය ලබා දෙන ලෙසයි.

අනතුරුව සභාවේ කෑ කෝ ගැසීමක් ඇති විය.

- බළන්ගොඩ නගර සභාවේ දෙවරක් නිතරගයෙන් පත් වූ කීර්තිමත් නගරාධිපතිවරයෙකු වූ සහ මෑත ඉතිහාසයේ බළන්ගොඩ නගරයට නිර්මාණශීලීම සංවර්ධනයක් එකතු කළ හිටපු පළාත් සභා මන්ත්‍රී විජය නිල්මිණී මැතිතුමාගේ භාර්යාව සහ බළන්ගොඩ නගර සභාවේ 2011-2015 දක්වා කාලයේ නාගරික මන්ත්‍රීවරයෙකුව සිටි අසංක විජය නිල්මිණී මැතිතුමාගේ මෑණියන් වූ තමන්ගේ නැන්දණිය කොරෝනා අසාදිතව අභාවප්‍රාප්ත වූ අතර, එතුමිය වෙනුවෙන් තමන්ගේ සහ ගරු උප සභාපතිතුමා ඇතුළු නාගරික මන්ත්‍රීවරුන්ගේ ද බළන්ගොඩ නගර සභාවේ ද ශෝකය පළ කරන ලදී.

- අතිගරු ජනාධිපතිතුමාගේ ක්‍රියාවන් ආණ්ඩුවේම ඇතැමුන් විවේචනය කරන නමුත් තමන් එතුමා සමඟ 100 % ක් එකඟ වන යම් යම් ක්‍රියාවන් පවතින බව ද පසුගිය 07 වන දින මොණරාගල දී විපක්ෂය සම්බන්ධව හොඳ කතාවක් කළ බව ද එහි දී තැන තැන උද්ඝෝෂණ, කඩාකප්පල් කිරීම් සිදු කරමින් සිටීමට වඩා ජනතාව මෙම අවස්ථාවේ දී පත් වී සිටින අපහසුතාවය නැති කර අවශ්‍ය කරන සහනයන්, සහයෝගයන් හා ක්‍රියාවන් සිදු කිරීමට දායක වන ලෙස ද රජයට කරන්න තිබෙන දෙයක් කිරීමට ඉඩ දෙන්නේ නැති අතර, අනිකුත් මිනිසුන් එය ඉටු කරන්නේ නැති බව ද ජනාධිපති ධූර කාලයෙන් වසර දෙකක් කොරෝනා නිසා ගෙවුණු අතර, එම වසර දෙකක කාලයේ විශාල රාජකාරී කොටසක් මඟ හැරීම සම්බන්ධයෙන් කණගාටු වන බව පැවසූ බව ද එම කතාව විශේෂයෙන් අසන ලෙස ගරු මන්ත්‍රීතුමන්ලා/තුමියන්ලාගෙන් ඉල්ලා සිටින බව ද අපගේ සභාවට විපක්ෂයක් නොමැති අතර, ගරු සභාපති ප්‍රමුඛ මන්ත්‍රී මණ්ඩලයක් සිටින බව ද එතුමාට මෙන්ම තමන්ටත් මහජනතාව වෙනුවෙන් වැඩ කිරීමට වසර දෙකක කාලයක් අහිමි වූ නමුත් ගැසට් පත්‍රයක් මගින් පුනරාවර්තන වියදම් පමණක් අනුමත කර ප්‍රාග්ධන වියදම් නවතා තිබිය දී පවා බළන්ගොඩ බදු ගෙවන ජනතාව සංතෝෂ වන හා තෘප්තිමත් වන ආකාරයෙන්, බළන්ගොඩ නගර සභාවට දොස් නොකියන ලෙස තමන්ට බාධාවන් අවහිරකම් සිදු කරන ගරු නාගරික මන්ත්‍රී හා මන්ත්‍රීවරියන්ගේ පොදු හා පෞද්ගලික ඉල්ලීම් ඉටු කර දීමට හැකි වීම සම්බන්ධයෙන් සතුටු වන බවද පළාත් සභාවේ හෝ පරිපාලනයේ යම් යම් ගැටලු නිසා පමා වීම් සිදු වුව ද සමස්ථයක් වශයෙන් බළන්ගොඩ නගරයේ ජනතාව තෘප්තිමත් වන ආකාරයෙන් වැඩ කටයුතු කිරීමට හැකි වීම පිළිබඳව සතුටු වන බව ද පැවසීය.

එමෙන්ම මේ දක්වා වසර 04 ක් අඛණ්ඩව ශ්‍රී ලංකාවේ හොඳම මූල්‍ය හා වාර්ෂික වාර්තාව සඳහා වන සම්මානය බළන්ගොඩ නගර සභාවට හිමි වූ අතර, ඒ සඳහා සහය ලබා දුන් ලේකම්තුමිය, ගණකාධිකාරීතුමා ඇතුළු කාර්ය මණ්ඩලයට සභාවේ ගෞරව ස්තුතිය පිරිනමන බව ද පවසන ලදී.

තවදුරටත් අදහස් දැක් වූ ගරු සභාපතිතුමා, නගර සභා පනත ප්‍රාදේශීය සභා පනත සේ නොවන බව ද යම් කිසි දවසක ඔබතුමන්ලා මෙම සභාවේ බලය ලබා ගත් අවස්ථාවක දී මේ සම්බන්ධව දැනුවත් වී සිටිය යුතු බව ද නගර සභාවේ සභා වාර්තාවක් සභාපතිවරයා සකස් කර අත්සන් කළ පමණින් සභා සම්මත බව ද වැරැද්දක් අඩුපාඩුවක් තිබේනම් සංශෝධනයක් ලෙස ඉදිරිපත් කිරීමට මහ සභාවට යොමු කරන අතර, එහි දී සංශෝධනය පමණක් ඇතුලත් කරන බව ද පැවසීය.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.ඩබ්.පී. ගුණරත්න මැතිතුමා අදහස් දක්වමින් ගරු සභාපතිතුමා දිගින් දිගටම අනවශ්‍ය ලෙස කතා කිරීම අවශ්‍ය නොවන අතර, සභාව නීත්‍යානුකූල නොවන බවට යෝජනා දෙක තුනක් ඉදිරිපත් කළ බව ද ඒ සඳහා උපදෙස් මේ සතියේ ලැබෙන තුරු සභාව කල් දමන ලෙස යෝජනා කර ස්ථිර කර බෙදීමක් ඉල්ලූ බව ද පැවසීය.

ගරු සභාපතිතුමා පැවසුවේ නීත්‍යානුකූල නොවන ඉල්ලීමකට බෙදීමක් ලබා දිය නොහැකි බැවින් එම ඉල්ලීම ප්‍රතික්ෂේප කරන බවයි.

නැවත වරක් ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.ඩබ්.පී. ගුණරත්න මැතිතුමා අදහස් දක්වමින් හොරෙන් හෝ බලයෙන් හෝ සභාව පැවැත්වීමට ආරම්භයක් අවශ්‍ය නිසා අංක 01 නොමැතිව අංක 02, අංක 03 සිට අංක 08 දක්වා නැවත මෙම සභාවේ සියලුම දේ ප්‍රතික්ෂේප කරන යෝජනාවක් ගෙන එන බවත්, මෙම සභාව පැවැත්වීමට නොහැකි බවට බෙදීමක් යෝජනා කරන බවත් පැවසූ අතර, එම යෝජනාව ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා ස්ථිර කරන ලදී.

මෙහි දී ගරු සභාපතිතුමා, න්‍යාය පත්‍රයේ එක් එක් කරුණ සඳහා වෙන වෙනම යාම සුදුසු බව පවසන ලදී.

**03. සංදේශ / පැමිණිලි / පෙත්සම් / ආයාචනා ඉදිරිපත් කිරීම**

**04. ටෙන්ඩර්පත් හා මිළ ගණන් විවෘත කිරීම.**

**05. කල් දී ඇති ප්‍රශ්න**

**05:01 ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.ඩබ්.පී.ගුණරත්න මැතිතුමා**

05:01:01 වැලිහරනාව මාර්ගයේ කුරේ මහතාගේ නිවාසවලට යන අතුරු මාර්ගය අනුමත වී ඇති අතර, (නඩත්තු) එය මේ ආත්මයේ දී කර ගත හැකි වේද?

ගරු සභාපතිතුමා විසින් ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.ඩබ්.පී. ගුණරත්න මැතිතුමා, ඉදිරිපත් කර ඇති කල් දී ඇති ප්‍රශ්නය ගරු සභාවට ඉදිරිපත් කිරීමේ දී නැවත සභාවේ කෑ කෝ ගැසීමක් ඇති විය.

මෙහි දී ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.ඩබ්.පී. ගුණරත්න මැතිතුමා අදහස් දක්වමින් ඉල්ලා ඇති බෙදීම ලබා දෙන ලෙස පැවසීය. එමෙන්ම අයවැය නීතිවිරෝධී සම්මත නොමැති බව කොමසාරිස්තුමා පැවසුව නමුත් ගරු සභාපතිවරයා එය පිළි නොගන්නා බව ද පසුගිය අයවැය බල රහිත කළේ අයවැය යෝජනාව ස්ථිර නොකළ නිසා බව ද තමන් අයවැය සම්මත යැයි පැවසූ බවට කතාව විකෘති කර තිබෙන බව ද අංක 02 සිට අවසානය දක්වා ප්‍රතික්ෂේප කරමින් යෝජනාවක් ගෙන ආ අතර, එය ස්ථිර කර බෙදීමක් ඉල්ලූ බව ද එය ලබා දිය යුතු බව ද ප්‍රජාතන්ත්‍රවාදය යනු එය බව ද පැවසීය.

ගරු සභාපතිතුමා පිළිතුරු ලබා දෙමින් පැවසූවේ පළාත් පාලන කොමසාරිස්තුමා නීත්‍යානුකූල නොවන උපදෙස් ලබා දී ඇති බවයි.

අනතුරුව කල් දී ඇති යෝජනා සම්බන්ධව සාකච්ඡා කිරීම සඳහා ගරු සභාපතිතුමා යොමු වන අවස්ථාවේ දී ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා, පළමු පිටුවේ සිට 11 වන පිටුව දක්වා බෙදීමක් ලබා දෙන ලෙස නැවත වරක් පැවසීය.

ඉන්පසු නැවතත් සභාවේ කෑ කෝ ගැසීමක් ඇති විය. එහි දී ලේකම්තුමියගෙන් කරුණු පැහැදිලි කර ගැනීම සඳහා කාරක සභාවක් බවට ගරු සභාව පත් කරන ලෙස ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා පවසා සිටිය නමුත් ගරු සභාපතිතුමා පිළිතුරු දෙමින් කාරක සභාවක අවශ්‍යතාවයක් නොමැති බවත්, පසුගිය සභාවේ දී ගරු නාගරික මන්ත්‍රීතුමන්ලා පිරිසක් විසින් දේශපාලන බලපෑම් මත පළාත් සභාවෙන් නිළධාරීන් 03 දෙනෙකු කැඳවා තිබුණු බවත්, අවුරුදු 25-30ක් නාගරික මන්ත්‍රීවරුන් ලෙස සිටින බව පවසන ගරු මන්ත්‍රීවරුන් පනතක් නීතියක් නොදන කටයුතු කරන බව හැසිරීමෙන් පෙනෙන බව ද පැවසූ අතර, රජයේ නිළධාරීන් බිල්ලට ගන්නේ කුමකටදැයි විමසීය.

එමෙන්ම යෝජනාවන් මහජනතාවට පැහැදිලි විය යුතු බැවින් එකින් එක සාකච්ඡා කිරීම සුදුසු බව ද පනත හා සභා රීතිවලට අනුව තමන් කටයුතු කරන බව ද පැවසීය.

**06. කල් දී ඇති යෝජනා**

**06:01 ගරු සභාපති චමික ජයමිණි විමලසේන මැතිතුමා**

**06:01:01 කාරක සභා පත්කිරීම**

**06:01:01;01 මුදල් කමිටුව පත් කිරීම හා බලතල පැවරීම.**

**මුදල් කමිටුවට පැවරෙන බලතල හා විෂය පථය**

බළන්ගොඩ නගර සභාවේ කාර්යයන් හා කර්තව්‍යයන්ට අදාලව රුපියල් ලක්ෂ 05ක් දක්වා වූ වියදම් අනුමත කිරීම, රුපියල් ලක්‍ෂ 05 ක් දක්වා වූ ඇස්තමේන්තු අනුමත කිරීම, ගරු සභාපතිවරයා විසින් සිදු කරනු ලබන රු. ලක්ෂ 05 ක් දක්වා වූ ගෙවීම් වෙනුවෙන් ආවරණ අනුමැතිය ලබාදීම, කර්මාන්ත කමිටුව, පුස්තකාල හා උපදේශන කමිටුව, සෞඛ්‍ය සණ අපද්‍රව්‍ය හා පරිසර කමිටුව, සංවර්ධන උපදේශන කමිටුව යන කමිටු වලින් නිර්දේශ කරනු ලබන රු. ලක්ෂ 05 දක්වා වූ වියදම් සඳහා අනුමැතිය ලබාදීම, රු. 250,000.00 සිට රු. 500,000.00 දක්වා වූ ප්‍රසම්පාදන කමිටුව ලෙස ක්‍රියාත්මක වීම අවස්ථානුකූලව තාක්ෂනික ඇගයීම් කමිටුව පත්කිරීම.නගර සභා ආඥා පනත, රජයේ

විවිධ රෙගුලාසි, චක්‍රලේඛ, අතුරු ව්‍යවස්ථා හා රීතින් වලට අනුකූල වන පරිදි ආදායම් උත්පාදනය, ආදායම් ඒකරාශී කිරීම, වියදම් කළමනාකරණය කිරීම සඳහා අවශ්‍ය මග පෙන්වීම හා පාලනය කිරීම, මූල්‍ය ස්ථාවරත්වය ගොඩ නැගීම සඳහා වන යෝජනා ගරු සභාවට ඉදිරිපත් කිරීම හා ගරු සභාව විසින් කලින් කලට පනවනු ලබන අනෙකුත් බලතල ක්‍රියාත්මක කිරීම උදෙසා වූ මුදල් කමිටුව පත්කිරීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්. විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහි දී ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා තම විරෝධතාවය පළ කරමින් අයවැය පරාද වීම තුළ ගරු සභාපතිතුමාට බලයක් නොමැති බැවින් බෙදීමක් යෝජනා කළ අතර, ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.ඩබ්.පී. ගුණරත්න මැතිතුමා ස්ථිර කරන ලදී.

මෙහි දී ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.ඩබ්.පී. ගුණරත්න මැතිතුමා පැවසූවේ අනවශ්‍ය ප්‍රශ්න ඇති කර ගත යුතු නැති අතර, නීත්‍යානුකූල නොවන බව පැවසීම අපගේ අයිතියක් බැවින් සභාව කල් දමන ලෙසයි.

ගරු සභාපතිතුමා පිළිතුරු ලබා දෙමින් චක්‍රලේඛයක් හෝ නොමැතිව පිළිගත නොහැකි බව පැවසීය.

අනතුරුව ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා අවශ්‍ය වන්නේ විවෘත ඡන්දයක්ද, රහස් ඡන්දයක්ද යන්න යෝජනා ස්ථිර කර ගන්නා ලෙස ගරු සභාපතිතුමන් විසින් ගරු සභාව වෙත දැනුම් දෙන ලදී.

එහි දී විවෘත ඡන්දයකට යාම සුදුසු බවට ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා කළ යෝජනාව ගරු නාගරික මන්ත්‍රිනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය ස්ථිර කරන ලදී.

ඒ අනුව පක්ෂව හා විපක්ෂව ඡන්දය ප්‍රකාශ කිරීම වෙනුවෙන් බෙදීමකට යන අතර, විවෘත ඡන්දයක් පැවැත්වීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස ගරු සභාපතිතුමන් විසින් ලේකම් වෙත දැනුම් දෙන ලදී.

මෙහිදී, එම යෝජනාවට පක්ෂව සභිකයින් හත් දෙනෙකු ද එනම්,

| | |
|---|---|
| 1. ගරු සභාපති | චමික ජයමිණි විමලසේන මැතිතුමා |
| 2. ගරු නාගරික මන්ත්‍රි | එම්. ජුනයිදීන් මලික්ෂා මැතිතුමා |
| 3. ගරු නාගරික මන්ත්‍රි | එම්. ඩබ්. විමලසිරි මැතිතුමා |
| 4. ගරු නාගරික මන්ත්‍රි | එම්. එම්. රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා |
| 5 ගරු නාගරික මන්ත්‍රිනි | පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය |
| 6. ගරු නාගරික මන්ත්‍රීනී | සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය |
| 7. ගරු නාගරික මන්ත්‍රී | කේ.ජී. පේමදාස මැතිතුමා යන අයත් |

විපක්ෂව සභිකවරුන් නව දෙනෙකුද එනම්,

1. ගරු නාගරික මන්ත්‍රී ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා
2. ගරු නාගරික මන්ත්‍රී ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා
3. ගරු නාගරික මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා
4. ගරු නාගරික මන්ත්‍රී එම්. නිමල් කරුණාරත්න මැතිතුමා
5. ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා
6. ගරු නාගරික මන්ත්‍රී එම්. එස්. පී. ගලප්පත්ති මැතිතුමා
7. ගරු නාගරික මන්ත්‍රිනි ජී. චන්ද්‍රලතා මැතිතුමිය
8. ගරු නාගරික මන්ත්‍රිනි එම්. ශාන්තිලේඛා මැතිතුමිය
9. ගරු නාගරික මන්ත්‍රිනී මංගලිකා ඉලංකෝන් මැතිතුමිය ද

ඡන්දය ප්‍රකාශ කළ අතර, ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමා අද දින සභාවට නොපැමිණිනි.

ඉහත ඡන්ද විමසීමට අනුව නගර සභා ආඥා පනත, රජයේ විවිධ රෙගුලාසි, චක්‍රලේඛ, අතුරු ව්‍යවස්ථා හා රීතින් වලට අනුකූල වන පරිදි ආදායම් උත්පාදනය, ආදායම් ඒකරාශී කිරීම, වියදම් කළමනාකරණය කිරීම සඳහා අවශ්‍ය මග පෙන්වීම හා පාලනය කිරීම, මූල්‍ය ස්ථාවරත්වය ගොඩ නැගීම සඳහා වන යෝජනා ගරු සභාවට ඉදිරිපත් කිරීම හා ගරු සභාව විසින් කලින් කලට පනවනු ලබන අනෙකුත් බලතල ක්‍රියාත්මක කිරීම උදෙසා වූ මුදල් කමිටුව පත්කිරීමේ යෝජනාවට පක්ෂව ඡන්ද 07 ක් ද විපක්ෂව ඡන්ද 09 ක් ද වශයෙන් වැඩි ඡන්ද දෙකකින් පරාජයට පත්විය.

මෙහි දී අදහස් දැක් වූ ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.ඩබ්.පී. ගුණරත්න මැතිතුමා, මුලින්ම කරන ලද යෝජනාවට ගරු සභාපතිතුමා ඉඩ නොදෙන නිසා ඡන්දය ලබා දුන් බව ද මෙම සභාව ප්‍රජාතන්ත්‍රවාදය උල්ලංඝනය කරමින් අනීතික ලෙස සහ ඒ පිළිබඳව වචනයක්වත් නොදන්නා ලෙස පවත්වන බව ද මේ සියල්ලම ප්‍රතික්ෂේප කරමින් යෝජනා ස්ථිර කර බෙදීමක් ඉල්ලූ නමුත් එය ලබා නොදී එකින් එකට වෙන වෙනම බෙදීම් ඉල්ලන බව ද මෙය නඩුවක් දැමීම සඳහා කරුණු සකස් කර ගැනීමට කරනු ලබන උප්පරවැට්ටියක් බව ද මෙම සභාවෙන් ඉවත් නොවන්නේ ගරු සභාපතිතුමා කරනු ලබන්නේ කුමක්දැයි තේරුම් ගැනීම සඳහා බව ද ඡන්දය ලබා දෙන්නේ නීත්‍යානුකූල ද නැද්ද යන්න සලකා නොව මෙතුමා කරනු ලබන දරදඬු, මුරණ්ඩු ක්‍රියාව ප්‍රතික්ෂේප කිරීමක් ලෙස බව ද එසේ නොමැති නම් මුලින්ම මෙම සභාව ප්‍රතික්ෂේප කර අවසන් බව ද පැවසීය.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් බුද්ධිමත් මිනිසුන් 1000 ක් සමඟ කතා කර, ඕනෑම දෙයක් තේරුම් කර දිය හැකි නමුත් බුද්ධියෙන් අඩු එක මනුස්සයෙක් සමඟ කතා කර කෙදිනකවත් තේරුම් කර දිය නොහැකි බව ද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ පැනවූ බලතල, නගර සභා ආඥා පනත, 2012 සංශෝධන වගන්තිය පිළිබඳව සහ පළාත් පාලන ක්‍රියාදාමය පිළිබඳව තේරුම් කරදීමට නොයා සහයෝගයෙන් පියවරෙන් පියවර නීත්‍යානුකූලව අවසන් කිරීමට අපේක්ෂා කරන බවද පවසන ලදී.

නැවතත් ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.ඩබ්.පී. ගුණරත්න මැතිතුමා මෙය නීත්‍යානුකූල නොවන බව පැවසීය.

**06෴01෴01;02 කර්මාන්ත කමිටුව**

නගර සභාව විසින් බල ප්‍රදේශය තුළ ඉටු කළ යුතු කර්මාන්ත සම්බන්ධව ප්‍රමුඛතා හඳුනාගෙන නිර්දේශ කිරීම, ප්‍රගතිය අදාළ පරිදි මුදල් කමිටුවට හා ගරු සභාවට ඉදිරිපත් කිරීම, කර්මාන්ත පිළිබඳ ගැටලු සම්බන්ධයෙන් නිර්දේශ ලබාදීම, තෝරා ගන්නා ලද කර්මාන්තකරුවන් පිළිබඳ නිර්දේශ ලබාදීම යන කාර්යයන් ඉටු කිරීම, ගරු සභාව විසින් කලින් කලට පනවනු ලබන අනෙකුත් බලතල ක්‍රියාත්මක කිරීම යන කරුණු උදෙසා වූ කර්මාන්ත කමිටුව පත් කිරීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රිනී තරංගනී සමරසේකර මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.ඩබ්.පී. ගුණරත්න මැතිතුමා අදහස් දක්වමින් අංක 02 සිට සියලුම යෝජනා ප්‍රතික්ෂේප කළ බැවින් මෙම යෝජනාව ද ප්‍රතික්ෂේප කරන බවත්, ගරු සභාපතිවරයා ඉවත් කර නොමැති නිසා සභාපති ධූරයේ නීත්‍යානුකූලව සිටීමට හැකි වුවත් 2022 වර්ෂයේ අයවැය සම්මත නොවූ බැවින් නීත්‍යානුකූල නොවන බව ද මේ සඳහා බෙදීමක් යෝජනා කරන බව ද පැවසීය.
එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා ස්ථිර කරන ලදී.

අනතුරුව ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා අවශ්‍ය වන්නේ විවෘත ඡන්දයක්ද, රහස් ඡන්දයක්ද යන්න යෝජනා ස්ථිර කර ගන්නා ලෙස ගරු සභාපතිතුමන් විසින් ගරු සභාව වෙත දැනුම් දෙන ලදී.

එහි දී විවෘත ඡන්දයකට යාම සුදුසු බවට ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා කළ යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ. ප්‍රේමකුමාර මැතිතුමා ස්ථිර කරන ලදී.

ඒ අනුව පක්ෂව හා විපක්ෂව ඡන්දය ප්‍රකාශ කිරීම වෙනුවෙන් බෙදීමකට යන අතර, විවෘත ඡන්දයක් පැවැත්වීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස ගරු සභාපතිතුමන් විසින් ලේකම් වෙත දැනුම් දෙන ලදී.

මෙහිදී, එම යෝජනාවට පක්ෂව සභිකයින් හත් දෙනෙකු ද එනම්,

| | |
|---|---|
| 1. ගරු සභාපති | චමික ජයමිණි විමලසේන මැතිතුමා |
| 2. ගරු නාගරික මන්ත්‍රී | එම්. ජුනයිදීන් මලික්ෂා මැතිතුමා |
| 3. ගරු නාගරික මන්ත්‍රී | එම්. ඩබ්. විමලසිරි මැතිතුමා |
| 4. ගරු නාගරික මන්ත්‍රී | එම්. එම්. රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා |
| 5 ගරු නාගරික මන්ත්‍රිනි | පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය |
| 6. ගරු නාගරික මන්ත්‍රීනී | සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය |
| 7. ගරු නාගරික මන්ත්‍රී | කේ.ජී. පේමදාස මැතිතුමා යන අයත් |

විපක්ෂව සභිකවරුන් නව දෙනෙකුද එනම්,

| | |
|---|---|
| 1. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා |
| 2. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා |

3. ගරු නාගරික මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා
4. ගරු නාගරික මන්ත්‍රී එම්. නිමල් කරුණාරත්න මැතිතුමා
5. ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා
6. ගරු නාගරික මන්ත්‍රී එම්. එස්. පී. ගලප්පත්ති මැතිතුමා
7. ගරු නාගරික මන්ත්‍රිනි ජී. චන්ද්‍රලතා මැතිතුමිය
8. ගරු නාගරික මන්ත්‍රිනි එම්. ශාන්තිලේඛා මැතිතුමිය
9. ගරු නාගරික මන්ත්‍රිනී මංගලිකා ඉලංකෝන් මැතිතුමිය ද

ඡන්දය ප්‍රකාශ කළ අතර, ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා අද දින සභාවට නොපැමිණිනි.

නගර සභාව විසින් බල ප්‍රදේශය තුළ ඉටු කළ යුතු කර්මාන්ත සම්බන්ධව ප්‍රමුඛතා හඳුනාගෙන නිර්දේශ කිරීම, ප්‍රගතිය අදාළ පරිදි මුදල් කමිටුවට හා ගරු සභාවට ඉදිරිපත් කිරීම, කර්මාන්ත පිළිබඳ ගැටලු සම්බන්ධයෙන් නිර්දේශ ලබාදීම, තෝරා ගන්නා ලද කර්මාන්තකරුවන් පිළිබඳ නිර්දේශ ලබාදීම යන කාර්යයන් ඉටු කිරීම, ගරු සභාව විසින් කලින් කලට පනවනු ලබන අනෙකුත් බලතල ක්‍රියාත්මක කිරීම යන කරුණු උදෙසා වූ කර්මාන්ත කමිටුව පත් කිරීමේ යෝජනාවට පක්ෂව ඡන්ද 07 ක් ද විපක්ෂව ඡන්ද 09 ක් ද වශයෙන් වැඩි ඡන්ද දෙකකින් පරාජයට පත්විය.

- **06ඃ01ඃ01;03 පරිසර සෞඛ්‍ය හා ඝන අපද්‍රව්‍ය කළමනාකරණ කමිටුව**

බළන්ගොඩ නගර සීමාව තුළ මහජනතාවට පොදුවේ බලපානු ලබන සෞඛ්‍ය ගැටලු පිළිබඳ සොයා බැලීම ඒවාට විසඳුම් යෝජනා කිරීම සහ නගරය පිරිසිදු කිරීම සම්බන්ධව පරීක්‍ෂා කිරීම හා වාර්තා කිරීම, බැංකියවත්ත ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයේ ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් පරීක්‍ෂා කිරීම, වැඩි දියුණු කිරීම සඳහා නිර්දේශ ලබාදීම, පාරිසරික සංරක්‍ෂණ කාර්යයන් හඳුනා ගැනීම සහ ඒ සඳහා නිර්දේශ මුදල් කමිටුවට හා සභාවට ඉදිරිපත් කිරීම, ගරු සභාව විසින් කලින් කලට පනවනු ලබන අනෙකුත් කාර්යයන් ඉටු කිරීම යන කරුණු උදෙසා වූ පරිසර සෞඛ්‍ය හා ඝන අපද්‍රව්‍ය කළමනාකරණ කමිටුව පත් කිරීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්. විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහි දී අදහස් දක්වූ ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ. ප්‍රේමකුමාර මැතිතුමා, සභාව නීත්‍යානුකූල නොවන බැවින් මෙම සියලුම යෝජනා ප්‍රතික්ෂේප කරන බවත්, මෙම යෝජනා අවශ්‍ය නොවන බව එයින් නොකියවෙන බවත් පැවසීය.

ඒ අනුව මෙම යෝජනාව සඳහා බෙදීමක් අවශ්‍ය බවට ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ. ප්‍රේමකුමාර මැතිතුමා යෝජනා කළ අතර, ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.ඩබ්.පී. ගුණරත්න මැතිතුමා ස්ථිර කරන ලදී.

අනතුරුව ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා අවශ්‍ය වන්නේ විවෘත ඡන්දයක්ද, රහස් ඡන්දයක්ද යන්න යෝජනා ස්ථිර කර ගන්නා ලෙස ගරු සභාපතිතුමන් විසින් ගරු සභාව වෙත දැනුම් දෙන ලදී.

එහි දී විවෘත ඡන්දයකට යාම සුදුසු බවට ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා කළ යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා ස්ථිර කරන ලදී.

ඒ අනුව පක්ෂව හා විපක්ෂව ඡන්දය ප්‍රකාශ කිරීම වෙනුවෙන් බෙදීමකට යන අතර, විවෘත ඡන්දයක් පැවැත්වීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස ගරු සභාපතිතුමන් විසින් ලේකම් වෙත දැනුම් දෙන ලදී.

මෙහිදී, එම යෝජනාවට පක්ෂව සභිකයින් හත් දෙනෙකු ද එනම්,

| | |
|---|---|
| 1. ගරු සභාපති | චමික ජයමිණි විමලසේන මැතිතුමා |
| 2. ගරු නාගරික මන්ත්‍රි | එම්. ජුනයිදීන් මලික්ෂා මැතිතුමා |
| 3. ගරු නාගරික මන්ත්‍රි | එම්. ඩබ්. විමලසිරි මැතිතුමා |
| 4. ගරු නාගරික මන්ත්‍රි | එම්. එම්. රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා |
| 5 ගරු නාගරික මන්ත්‍රිනි | පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය |
| 6. ගරු නාගරික මන්ත්‍රිනී | සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය |
| 7. ගරු නාගරික මන්ත්‍රී | කේ.ජී. පේමදාස මැතිතුමා යන අයත් |

විපක්ෂව සභිකවරුන් නව දෙනෙකුද එනම්,

| | |
|---|---|
| 1. ගරු නාගරික මන්ත්‍රි | ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා |
| 2. ගරු නාගරික මන්ත්‍රි | ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා |
| 3. ගරු නාගරික මන්ත්‍රි | ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා |
| 4. ගරු නාගරික මන්ත්‍රි | එම්. නිමල් කරුණාරත්න මැතිතුමා |
| 5. ගරු නාගරික මන්ත්‍රී | නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා |
| 6. ගරු නාගරික මන්ත්‍රි | එම්. එස්. පී. ගලප්පත්ති මැතිතුමා |
| 7. ගරු නාගරික මන්ත්‍රිනි | ජී. චන්ද්‍රලතා මැතිතුමිය |
| 8. ගරු නාගරික මන්ත්‍රිනි | එම්. ශාන්තිලේඛා මැතිතුමිය |
| 9. ගරු නාගරික මන්ත්‍රිනී | මංගලිකා ඉලංකෝන් මැතිතුමිය ද |

ඡන්දය ප්‍රකාශ කළ අතර, ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා අද දින සභාවට නොපැමිණිනි.

බළන්ගොඩ නගර සීමාව තුළ මහජනතාවට පොදුවේ බලපානු ලබන සෞඛ්‍ය ගැටලු පිළිබඳ සොයා බැලීම ඒවාට විසඳුම් යෝජනා කිරීම සහ නගරය පිරිසිදු කිරීම සම්බන්ධව පරීක්ෂා කිරීම හා වාර්තා කිරීම, බැංකියවත්ත ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් පරීක්ෂා කිරීම, වැඩි දියුණු කිරීම සඳහා නිර්දේශ ලබාදීම, පාරිසරික සංරක්ෂණ කාර්යයන් හඳුනා ගැනීම සහ ඒ සඳහා නිර්දේශ මුදල් කමිටුවට හා සභාවට ඉදිරිපත් කිරීම, ගරු සභාව විසින් කලින් කලට පනවනු ලබන අනෙකුත් කාර්යයන් ඉටු කිරීම යන කරුණු උදෙසා වූ පරිසර සෞඛ්‍ය හා

ඝන අපද්‍රව්‍ය කළමනාකරණ කමිටුව පත් කිරීමේ යෝජනාවට පක්ෂව ඡන්ද 07 ක් ද විපක්ෂව ඡන්ද 09 ක් ද වශයෙන් වැඩි ඡන්ද දෙකකින් පරාජයට පත්විය.

- **06ඃ01ඃ01;04 පුස්තකාල උපදේශන කමිටුව පත්කිරීම**

පුස්තකාල පොත් මිලදී ගැනීමට නිර්දේශ ලබාගැනීම, පාඨක සමාජයේ යෝජනා සම්මත කර ගැනීම, පුස්තකාල සංවර්ධන කටයුතු සාකච්ඡා කර යෝජනා මුදල් කමිටුවට /ගරු සභාවට ඉදිරිපත් කිරීම,ගාස්තු අඩු හෝ වැඩි කිරීම සාකච්ඡා කර නිර්දේශ ඉදිරිපත් කිරීම, සඟරා නිකුත් කිරීමේ දී ලිපි ලබාගැනීම සහ සංස්කරණ කටයුතු සඳහා සහභාගි කර ගැනීම, ගරු සභාව විසින් කලින් කලට පනවනු ලබන අනෙකුත් බලතල ක්‍රියාත්මක කිරීම යන කරුණු උදෙසා වූ පුස්තකාල උපදේශන කමිටුව පත් කිරීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙම යෝජනාව සඳහා බෙදීමක් අවශ්‍ය බවට ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා යෝජනා කළ අතර, ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා ස්ථිර කරන ලදී.

අනතුරුව ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා අවශ්‍ය වන්නේ විවෘත ඡන්දයක්ද, රහස් ඡන්දයක්ද යන්න යෝජනා ස්ථිර කර ගන්නා ලෙස ගරු සභාපතිතුමන් විසින් ගරු සභාව වෙත දැනුම් දෙන ලදී.

එහි දී විවෘත ඡන්දයකට යාම සුදුසු බවට ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා කළ යෝජනාව ගරු නාගරික මන්ත්‍රිනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය ස්ථිර කරන ලදී.

ඒ අනුව පක්ෂව හා විපක්ෂව ඡන්දය ප්‍රකාශ කිරීම වෙනුවෙන් බෙදීමකට යන අතර, විවෘත ඡන්දයක් පැවැත්වීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස ගරු සභාපතිතුමන් විසින් ලේකම් වෙත දැනුම් දෙන ලදී.

මෙහිදී, එම යෝජනාවට පක්ෂව සභිකයින් හත් දෙනෙකු ද එනම්,

| | |
|---|---|
| 1. ගරු සභාපති | චමික ජයමිණි විමලසේන මැතිතුමා |
| 2. ගරු නාගරික මන්ත්‍රි | එම්. ජුනයිදීන් මලික්ෂා මැතිතුමා |
| 3. ගරු නාගරික මන්ත්‍රි | එම්. ඩබ්. විමලසිරි මැතිතුමා |
| 4. ගරු නාගරික මන්ත්‍රි | එම්. එම්. රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා |
| 5 ගරු නාගරික මන්ත්‍රිනි | පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය |
| 6. ගරු නාගරික මන්ත්‍රීනී | සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය |
| 7. ගරු නාගරික මන්ත්‍රී | කේ.ජී. පේමදාස මැතිතුමා යන අයත් |

විපක්ෂව සභිකවරුන් නව දෙනෙකුද එනම්,

| | |
|---|---|
| 1. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා |
| 2. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා |
| 3. ගරු නාගරික මන්ත්‍රී | ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා |
| 4. ගරු නාගරික මන්ත්‍රී | එම්. නිමල් කරුණාරත්න මැතිතුමා |
| 5. ගරු නාගරික මන්ත්‍රී | නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා |
| 6. ගරු නාගරික මන්ත්‍රී | එම්. එස්. පී. ගලප්පත්ති මැතිතුමා |
| 7. ගරු නාගරික මන්ත්‍රිනි | ජී. චන්ද්‍රලතා මැතිතුමිය |
| 8. ගරු නාගරික මන්ත්‍රිනි | එම්. ශාන්තිලේඛා මැතිතුමිය |
| 9. ගරු නාගරික මන්ත්‍රිනී | මංගලිකා ඉලංකෝන් මැතිතුමිය ද |

ඡන්දය ප්‍රකාශ කළ අතර, ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමා අද දින සභාවට නොපැමිණිනි.

පුස්තකාල පොත් මිලදී ගැනීමට නිර්දේශ ලබාගැනීම, පාඨක සමාජයේ යෝජනා සම්මත කර ගැනීම, පුස්තකාල සංවර්ධන කටයුතු සාකච්ඡා කර යෝජනා මුදල් කමිටුවට /ගරු සභාවට ඉදිරිපත් කිරීම,ගාස්තු අඩු හෝ වැඩි කිරීම සාකච්ඡා කර නිර්දේශ ඉදිරිපත් කිරීම, සඟරා නිකුත් කිරීමේ දී ලිපි ලබාගැනීම සහ සංස්කරණ කටයුතු සඳහා සහභාගි කර ගැනීම, ගරු සභාව විසින් කලින් කලට පනවනු ලබන අනෙකුත් බලතල ක්‍රියාත්මක කිරීම යන කරුණු උදෙසා වූ පුස්තකාල උපදේශන කමිටුව පත් කිරීමේ යෝජනාවට පක්ෂව ඡන්ද 07 ක් ද විපක්ෂව ඡන්ද 09 ක් ද වශයෙන් වැඩි ඡන්ද දෙකකින් පරාජයට පත්විය.

- **06ඃ01ඃ01;05 සංවර්ධන උපදේශන කමිටුව පත්කිරීම**

බළන්ගොඩ නගර සභා සීමාව තුළ පවතින සියලු සංවර්ධන කටයුතු සඳහා සහ ගරු සභාවේ උන්නතිය, ආදායම් ඒකරාශි කිරීම/ආදායම් මාර්ග වැඩිදියුණු කිරීම ආදී සියලු සේවාවන් සඳහා උපදේශනය ලබාදීම, ගරු සභාව විසින් කලින් කලට පනවනු ලබන අනෙකුත් බලතල ක්‍රියාත්මක කිරීම යන කරුණු උදෙසා සංවර්ධන උපදේශන කමිටුව පත් කිරීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රිනී තරංගනී සමරසේකර මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිවරයා සභාපති වශයෙන් පිළි නොගන්නා බැවින් මෙම යෝජනාවට බෙදීමක් අවශ්‍ය බවට ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා යෝජනා කළ අතර, ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා ස්ථිර කරන ලදී.

අනතුරුව ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා අවශ්‍ය වන්නේ විවෘත ඡන්දයක්ද, රහස් ඡන්දයක්ද යන්න යෝජනා ස්ථිර කර ගන්නා ලෙස ගරු සභාපතිතුමන් විසින් ගරු සභාව වෙත දැනුම් දෙන ලදී.

එහි දී විවෘත ඡන්දයකට යාම සුදුසු බවට ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා කළ යෝජනාව ගරු නාගරික මන්ත්‍රීනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය ස්ථිර කරන ලදී.

ඒ අනුව පක්ෂව හා විපක්ෂව ඡන්දය ප්‍රකාශ කිරීම වෙනුවෙන් බෙදීමකට යන අතර, විවෘත ඡන්දයක් පැවැත්වීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස ගරු සභාපතිතුමන් විසින් ලේකම් වෙත දැනුම් දෙන ලදී.

මෙහිදී, එම යෝජනාවට පක්ෂව සභිකයින් හත් දෙනෙකු ද එනම්,

| | |
|---|---|
| 1. ගරු සභාපති | චමික ජයමිණි විමලසේන මැතිතුමා |
| 2. ගරු නාගරික මන්ත්‍රි | එම්. ජුනයිදීන් මලික්ෂා මැතිතුමා |
| 3. ගරු නාගරික මන්ත්‍රි | එම්. ඩබ්. විමලසිරි මැතිතුමා |
| 4. ගරු නාගරික මන්ත්‍රි | එම්. එම්. රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා |
| 5 ගරු නාගරික මන්ත්‍රිනි | පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය |
| 6. ගරු නාගරික මන්ත්‍රීනී | සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය |
| 7. ගරු නාගරික මන්ත්‍රී | කේ.ජී. පේමදාස මැතිතුමා යන අයත් |

විපක්ෂව සභිකවරුන් නව දෙනෙකුද එනම්,

| | |
|---|---|
| 1. ගරු නාගරික මන්ත්‍රි | ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා |
| 2. ගරු නාගරික මන්ත්‍රි | ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා |
| 3. ගරු නාගරික මන්ත්‍රි | ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා |
| 4. ගරු නාගරික මන්ත්‍රි | එම්. නිමල් කරුණාරත්න මැතිතුමා |
| 5. ගරු නාගරික මන්ත්‍රී | නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා |
| 6. ගරු නාගරික මන්ත්‍රි | එම්. එස්. පී. ගලප්පත්ති මැතිතුමා |
| 7. ගරු නාගරික මන්ත්‍රිනි | ජී. චන්ද්‍රලතා මැතිතුමිය |
| 8. ගරු නාගරික මන්ත්‍රිනි | එම්. ශාන්තිලේඛා මැතිතුමිය |
| 9. ගරු නාගරික මන්ත්‍රිනී | මංගලිකා ඉලංකෝන් මැතිතුමිය ද |

ඡන්දය ප්‍රකාශ කළ අතර, ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා අද දින සභාවට නොපැමිණිනි.

බළන්ගොඩ නගර සභා සීමාව තුළ පවතින සියලු සංවර්ධන කටයුතු සඳහා සහ ගරු සභාවේ උන්නතිය, ආදායම් ඒකරාශි කිරීම/ආදායම් මාර්ග වැඩිදියුණු කිරීම ආදී සියලු සේවාවන් සඳහා උපදේශනය ලබාදීම, ගරු සභාව විසින් කලින් කලට පනවනු ලබන අනෙකුත් බලතල ක්‍රියාත්මක කිරීම යන කරුණු උදෙසා සංවර්ධන උපදේශන කමිටුව පත් කිරීමේ යෝජනාවට පක්ෂව ඡන්ද 07 ක් ද විපක්ෂව ඡන්ද 09 ක් ද වශයෙන් වැඩි ඡන්ද දෙකකින් පරාජයට පත්විය.

- **06ඃ01ඃ01;06 කාර්යාලයීය ප්‍රසම්පාදන කමිටුව**

රුපියල් 250,000.00 දක්වා කාර්යාලයීය ප්‍රසම්පාදන කමිටුව ලෙස,

1. ගරු සභාපති, චමික ජයමිණි විමලසේන මැතිතුමා
2. ලේකම්, එස්.එච්.ඒ.කරුණාත්න මිය

3. ගණකාධිකාරී, එම්. ඩී. එස්. ප්‍රනාන්දු මයා
4. ප්‍රධාන කළමනාකරණ සහකාර, ජී. ඩී. ඒ. සේමපාල මිය
5. වැඩ අධිකාරී, පී.එම්.එස්.සේනාධීර මයා
6. පුස්තකාලාධිපතිනි, උමුදුනි විදානපතිරණ මිය
7. මහජන සෞඛ්‍ය පරීක්ෂක, ඒ.එම්.සී.එල්.ආඳාදොළ මයා
8. පෙර පාසල් පාලිකා, ඩබ්.එම්.සෙව්වන්දි සමන්මලී වීරසිංහ මිය
9. ආයුර්වේද වෛද්‍ය නිලධාරිනි ඩබ්. ඩබ්. සධානා සංජීවනී පුෂ්පකුමාරි මිය

යන සාමාජිකයින්ගෙන් යුත් කාර්යාලයීය ප්‍රසම්පාදන කමිටු පත් කිරීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ්. විමලසිරි මැතිතුමා ස්ථිර කරන ලදී.

මෙම යෝජනාවට බෙදීමක් අවශ්‍ය බවට ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා යෝජනා කළ අතර, ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා ස්ථිර කරන ලදී.

අනතුරුව ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා අවශ්‍ය වන්නේ විවෘත ඡන්දයක්ද, රහස් ඡන්දයක්ද යන්න යෝජනා ස්ථිර කර ගන්නා ලෙස ගරු සභාපතිතුමන් විසින් ගරු සභාව වෙත දැනුම් දෙන ලදී.

එහි දී විවෘත ඡන්දයකට යාම සුදුසු බවට ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා කළ යෝජනාව ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා ස්ථිර කරන ලදී.

ඒ අනුව පක්ෂව හා විපක්ෂව ඡන්දය ප්‍රකාශ කිරීම වෙනුවෙන් බෙදීමකට යන අතර, විවෘත ඡන්දයක් පැවැත්වීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස ගරු සභාපතිතුමන් විසින් ලේකම් වෙත දැනුම් දෙන ලදී.

මෙහිදී, එම යෝජනාවට පක්ෂව සභිකයින් හත් දෙනෙකු ද එනම්,

| | |
|---|---|
| 1. ගරු සභාපති | චමික ජයමිණි විමලසේන මැතිතුමා |
| 2. ගරු නාගරික මන්ත්‍රි | එම්. ජුනයිදීන් මලික්ෂා මැතිතුමා |
| 3. ගරු නාගරික මන්ත්‍රි | එම්. ඩබ්. විමලසිරි මැතිතුමා |
| 4. ගරු නාගරික මන්ත්‍රි | එම්. එම්. රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා |
| 5 ගරු නාගරික මන්ත්‍රිනි | පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය |
| 6. ගරු නාගරික මන්ත්‍රීනී | සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය |
| 7. ගරු නාගරික මන්ත්‍රී | කේ.ජී. පේමදාස මැතිතුමා යන අයත් |

විපක්ෂව සභිකවරුන් නව දෙනෙකුද එනම්,

| | |
|---|---|
| 1. ගරු නාගරික මන්ත්‍රි | ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා |
| 2. ගරු නාගරික මන්ත්‍රි | ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා |
| 3. ගරු නාගරික මන්ත්‍රි | ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා |
| 4. ගරු නාගරික මන්ත්‍රි | එම්. නිමල් කරුණාරත්න මැතිතුමා |
| 5. ගරු නාගරික මන්ත්‍රී | නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා |

6. ගරු නාගරික මන්ත්‍රී එම්. එස්. පී. ගලප්පත්ති මැතිතුමා
7. ගරු නාගරික මන්ත්‍රිනි ජී. චන්ද්‍රලතා මැතිතුමිය
8. ගරු නාගරික මන්ත්‍රිනි එම්. ශාන්තිලේඛා මැතිතුමිය
9. ගරු නාගරික මන්ත්‍රිනී මංගලිකා ඉලංකෝන් මැතිතුමිය ද

ඡන්දය ප්‍රකාශ කළ අතර, ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා අද දින සභාවට නොපැමිණිනි.

රුපියල් 250,000.00 දක්වා කාර්යාලයීය ප්‍රසම්පාදන කමිටුව ලෙස,

1. ගරු සභාපති, චමික ජයමිණි විමලසේන මැතිතුමා
2. ලේකම්, එස්.එච්.ජී.කරුණාරත්න මිය
3. ගණකාධිකාරී, එම්. ඩී. එස්. ප්‍රනාන්දු මයා
4. ප්‍රධාන කළමනාකරණ සහකාර, ජී. ඩී. ඒ. සේමපාල මිය
5. වැඩ අධිකාරී, පී.එම්.එස්.සේනාධීර මයා
6. පුස්තකාලාධිපතිනි, උමුදුනි විදානපතිරණ මිය
7. මහජන සෞඛ්‍ය පරීක්ෂක, ඒ.එම්.සී.එල්.ආඳාදොළ මයා
8. පෙර පාසල් පාලිකා, ඩබ්.එම්.සෙව්වන්දි සමන්මලී වීරසිංහ මිය
9. ආයුර්වේද වෛද්‍ය නිලධාරිනි ඩබ්. ඩබ්. සධානා සංජීවනී පුෂ්පකුමාරි මිය

යන සාමාජිකයින්ගෙන් යුත් කාර්යාලයීය ප්‍රසම්පාදන කමිටු පත් කිරීමේ යෝජනාවට පක්ෂව ඡන්ද 07 ක් ද විපක්ෂව ඡන්ද 09 ක් ද වශයෙන් වැඩි ඡන්ද දෙකකින් පරාජයට පත්විය.

- **06ඃ01ඃ01;07 තාක්ෂණික ඇගයීම් කමිටුව**

තාක්ෂණික ඇගයීම් කමිටුව සඳහා,

1. ගණකාධිකාරී, එම්. ඩී. එස්. ප්‍රනාන්දු මයා
2. වැඩ අධිකාරී, පී.එම්.එස්.සේනාධීර මයා
3. තාක්ෂණ නිළධාරී,ඩබ්.එම්.සී.එම්.බී. මානිපුර මයා
4. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිළධාරී සංකල්ප ප්‍රේමදාස මයා
5. අදාළ විෂය පිළිබඳ ප්‍රවීනයින් (අවස්ථානුකූලව පත්කර ගැනීම /බාහිරින් පත් කිරීම)

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනි තරංගනී සමරසේකර මැතිතුමිය ස්ථිර කරන ලදී.

ගරු සභාව ආරම්භයේ දීම නීත්‍යානුකූල නොවන සභාවක් බව ප්‍රකාශ කරමින් බෙදීමක් ඉල්ලා සිටි නමුත් එය ලබා නොදුන් අතර, තවදුරටත් විරෝධතාවය ප්‍රකාශ කරමින් මෙම යෝජනාවට බෙදීමක් අවශ්‍ය බවට ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා යෝජනා කළ අතර, ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.ඩබ්. පී. ගුණරත්න මැතිතුමා ස්ථිර කරන ලදී.

අනතුරුව ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා අවශ්‍ය වන්නේ විවෘත ඡන්දයක්ද, රහස් ඡන්දයක්ද යන්න යෝජනා ස්ථිර කර ගන්නා ලෙස ගරු සභාපතිතුමන් විසින් ගරු සභාව වෙත දැනුම් දෙන ලදී.

එහි දී විවෘත ඡන්දයකට යාම සුදුසු බවට ගරු නාගරික මන්ත්‍රිනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය යෝජනා කළ අතර, එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා ස්ථිර කරන ලදී.

ඒ අනුව පක්ෂව හා විපක්ෂව ඡන්දය ප්‍රකාශ කිරීම වෙනුවෙන් බෙදීමකට යන අතර, විවෘත ඡන්දයක් පැවැත්වීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස ගරු සභාපතිතුමන් විසින් ලේකම් වෙත දැනුම් දෙන ලදී.

මෙහිදී, එම යෝජනාවට පක්ෂව සභිකයින් හත් දෙනෙකු ද එනම්,

| | |
|---|---|
| 1. ගරු සභාපති | චමික ජයමිණි විමලසේන මැතිතුමා |
| 2. ගරු නාගරික මන්ත්‍රි | එම්. ජුනයිදීන් මලික්ෂා මැතිතුමා |
| 3. ගරු නාගරික මන්ත්‍රි | එම්. ඩබ්. විමලසිරි මැතිතුමා |
| 4. ගරු නාගරික මන්ත්‍රි | එම්. එම්. රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා |
| 5 ගරු නාගරික මන්ත්‍රිනි | පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය |
| 6. ගරු නාගරික මන්ත්‍රිනී | සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය |
| 7. ගරු නාගරික මන්ත්‍රී | කේ.ජී. පේමදාස මැතිතුමා යන අයත් |

විපක්ෂව සභිකවරුන් නව දෙනෙකුද එනම්,

| | |
|---|---|
| 1. ගරු නාගරික මන්ත්‍රි | ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා |
| 2. ගරු නාගරික මන්ත්‍රි | ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා |
| 3. ගරු නාගරික මන්ත්‍රි | ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා |
| 4. ගරු නාගරික මන්ත්‍රි | එම්. නිමල් කරුණාරත්න මැතිතුමා |
| 5. ගරු නාගරික මන්ත්‍රී | නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා |
| 6. ගරු නාගරික මන්ත්‍රි | එම්. එස්. පී. ගලප්පත්ති මැතිතුමා |
| 7. ගරු නාගරික මන්ත්‍රිනි | ජී. චන්ද්‍රලතා මැතිතුමිය |
| 8. ගරු නාගරික මන්ත්‍රිනි | එම්. ශාන්තිලේඛා මැතිතුමිය |
| 9. ගරු නාගරික මන්ත්‍රිනී | මංගලිකා ඉලංකෝන් මැතිතුමිය ද |

ඡන්දය ප්‍රකාශ කළ අතර, ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා අද දින සභාවට නොපැමිණිනි.

ඒ අනුව තාක්ෂණික ඇගයීම් කමිටුව පත් කිරීමේ යෝජනාවට පක්ෂව ඡන්ද 07 ක් ද විපක්ෂව ඡන්ද 09 ක් ද වශයෙන් වැඩි ඡන්ද දෙකකින් පරාජයට පත්විය.

**06:01:02** ගබඩා අවශ්‍යතා සඳහා අවශ්‍ය පහත සඳහන් ද්‍රව්‍ය මිළදී ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

| **ද්‍රව්‍ය** | **ප්‍රමාණය** |
|---|---|
| 13.6 x 28 Tyre | 04 |
| 12 x 28 | 02 |
| 650 x 16 Tyre | 04 |
| 700 x 16 Tyre | 03 |
| 650 x 15 Tyre | 03 |
| 600 x 16 Collors | 03 |
| 700 x 16 Collors | 03 |
| 750 x 16 Collors | 03 |
| 600 x 16 Tractor Tyre | 02 |
| වෙනත් ආදායම් ලේඛන | 10 |
| ෆයිල් ටැග් | 2000 |
| දෙපියන් ෆයිල් (නිල්) | 100 |
| බෝල්පොයින්ට් පෙන් | 500 |
| 10 × 7 ලියුම් කවර | 100 |
| 10 × 15 ලියුම් කවර | 100 |
| ටිපෙක්ස් | 12 |

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්. විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.ඩබ්.පී. ගුණරත්න මැතිතුමා පැවසුවේ ගරු සභාව පිළිබඳව සිතා ගරු සභාපතිතුමන් විසින් සාධාරණ තීරණයක් ගන්නා ලෙසයි.

ගරු සභාපතිතුමා පිළිතුරු ලබා දෙමින් පනත සමඟ නීත්‍යානුකූලව සියලුම කටයුතු කරන බව පැවසීය.

ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ. ප්‍රේමකුමාර මැතිතුමා අදහස් දක්වමින් සභාව නීත්‍යානුකූල ද නැද්ද යන්න සඳහන් කර ගරු ආණ්ඩුකාරතුමා සහ පළාත් පාලන කොමසාරිස්තුමා දන්වන තුරු න්‍යාය පත්‍රයේ සියලුම යෝජනා ප්‍රතික්ෂේප කරන බවට යෝජනා කළ අතර, ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.ඩබ්.පී. ගුණරත්න මැතිතුමා ස්ථිර කරන ලදී.

ඒ සඳහා විවෘත ඡන්දයක් සුදුසු බවට ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ. ප්‍රේමකුමාර මැතිතුමා යෝජනා කළ අතර, ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා පැවසුවේ යෝජනා එකින් එකට සාකච්ඡා කරන ලෙසයි.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා, එකින් එක සාකච්ඡා කිරීම සිදු කරන ලෙස පැවසීය.

ඒ අනුව පක්ෂව හා විපක්ෂව ඡන්දය ප්‍රකාශ කිරීම වෙනුවෙන් බෙදීමකට යන අතර, විවෘත ඡන්දයක් පැවැත්වීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස ගරු සභාපතිතුමන් විසින් ලේකම් වෙත දැනුම් දෙන ලදී.

මෙහිදී, එම යෝජනාවට පක්ෂව සභිකයින් හත් දෙනෙකු ද එනම්,

| | |
|---|---|
| 1. ගරු සභාපති | චමික ජයමිණි විමලසේන මැතිතුමා |
| 2. ගරු නාගරික මන්ත්‍රි | එම්. ජුනයිදීන් මලික්ෂා මැතිතුමා |
| 3. ගරු නාගරික මන්ත්‍රි | එම්. ඩබ්. විමලසිරි මැතිතුමා |
| 4. ගරු නාගරික මන්ත්‍රි | එම්. එම්. රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා |
| 5 ගරු නාගරික මන්ත්‍රිනි | පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය |
| 6. ගරු නාගරික මන්ත්‍රිනී | සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය |
| 7. ගරු නාගරික මන්ත්‍රී | කේ.ජී. පේමදාස මැතිතුමා යන අයත් |

විපක්ෂව සභිකවරුන් නව දෙනෙකුද එනම්,

| | |
|---|---|
| 1. ගරු නාගරික මන්ත්‍රි | ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා |
| 2. ගරු නාගරික මන්ත්‍රි | ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා |
| 3. ගරු නාගරික මන්ත්‍රි | ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා |
| 4. ගරු නාගරික මන්ත්‍රි | එම්. නිමල් කරුණාරත්න මැතිතුමා |
| 5. ගරු නාගරික මන්ත්‍රී | නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා |
| 6. ගරු නාගරික මන්ත්‍රි | එම්. එස්. පී. ගලප්පත්ති මැතිතුමා |
| 7. ගරු නාගරික මන්ත්‍රිනි | ජී. චන්ද්‍රලතා මැතිතුමිය |
| 8. ගරු නාගරික මන්ත්‍රිනි | එම්. ශාන්තිලේඛා මැතිතුමිය |
| 9. ගරු නාගරික මන්ත්‍රිනී | මංගලිකා ඉලංකෝන් මැතිතුමිය ද |

ඡන්දය ප්‍රකාශ කළ අතර, ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා අද දින සභාවට නොපැමිණිනි.

ඒ අනුව ගබඩා අවශ්‍යතා සඳහා අවශ්‍ය ද්‍රව්‍ය මිළදී ගැනීමේ යෝජනාවට පක්ෂව ඡන්ද 07 ක් ද විපක්ෂව ඡන්ද 09 ක් ද වශයෙන් වැඩි ඡන්ද දෙකකින් පරාජයට පත්විය.

06ඃ01ඃ03 (A) රු.10,000.00 ට වැඩි ගෙවීම් සඳහා පූර්ව අනුමැතිය ලබා ගැනීම.

- 227-5020 ගලි බවුසරය පූර්ණ සේවා කිරීම වෙනුවෙන් කේ.ඒ.ඉංජිනියරින් ඇන්ඩ් කේ.ඒ. ඔටෝ ක්ලීන් ආයතනය වෙත රු.22,400.00 ක මුදලක් ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

- 56-1906 කෘෘ කැබ් රථය පූර්ණ සේවා කිරීම වෙනුවෙන් කේ.ඒ.ඉංජිනියරින් ඇන්ඩ් කේ.ඒ. ඔටෝ ක්ලීන් ආයතනය වෙත රු.13,740.00 ක මුදලක් ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

- PF 4006 කැබ් රථය පූර්ණ සේවා කිරීම වෙනුවෙන් කේ.ඒ.ඉංජිනියරින් ඇන්ඩ් කේ.ඒ. ඔටෝ ක්ලීන් ආයතනය වෙත රු.16,100.00 ක මුදලක් ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

- RE 2600 ට්‍රැක්ටර් රථය පූර්ණ සේවා කිරීම වෙනුවෙන් රිෂානා සර්විස් ආයතනය වෙත රු.22,910.00 ක මුදලක් ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

- RC 1118, RB 4786, HF 8558 යන ට්‍රැක්ටර් රථවල වහල අලුත්වැඩියා කිරීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය ලබා ගැනීම වෙනුවෙන් පී.එම්.කේ. හාඩ්වෙයාර් වෙත රු.10,585.00, රු. 17,085.00 හා රු. 17,085.00 ක් වශයෙන් මුදල් ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

- RC 1118, RB 4786, HF 8558 යන ට්‍රැක්ටර් රථවල වහලයෙහි ටෙන්ඩ් එක ගැසීම වෙනුවෙන් ලාල් කුෂන් වෙත එකක් රු. 26,000.00 බැගින් රු. 78,000.00 ක මුදලක් ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

- රත්නපුර මහාධිකරණ නඩු අංක 15/2020 දරණ නඩුව සඳහා පෙනී සිටීම සහ විරෝධතා ගොනුකිරීම වෙනුවෙන් රු. 35,000.00 ක මුදලක් නීතිඥ තුෂාරි සූරියආරච්චි යන අය වෙත ගෙවීම වෙනුවෙන් සභා අනුමැතිය ලබා ගැනීම

- රත්නපුර පාර නිල නිවාස සඳහා ජල නල හා සින්ක් එකක් මිල දී ගැනීම වෙනුවෙන් PMK හාඩ්වෙයාර් වෙත රු.10,250.00 ක මුදලක් ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

- කියවීම් ශාලාව තීන්ත ආලේප කිරීම සඳහා ද්‍රව්‍ය මිල දී ගැනීම වෙනුවෙන් ද පේන්ට් හවුස් වෙත රු. 20,150.00 ක මුදලක් ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

- 2021-12-08 දින දිනමිණ සහ තිණකරන් පුවත්පත්හි (මස් කඩ) ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් පල කිරීම වෙනුවෙන් සී/ස එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමට රු. 79,164.00 ක මුදලක් ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රිනී තරංගනී සමරසේකර මැතිතුමිය ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් ගෙනෙන ලද යෝජනාව ප්‍රතික්ෂේප කර බෙදීමක් අවශ්‍ය බවට ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.ඩබ්.පී. ගුණරත්න මැතිතුමා යෝජනා කළ අතර, ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා ස්ථිර කරන ලදී.

මේ සඳහා අවශ්‍ය වන්නේ විවෘත ඡන්දයක්ද රහස්‍ය ඡන්දයක් ද යන්න විමසූ අතර, ගරු නාගරික මන්ත්‍රීනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය විවෘත ඡන්දයක් සුදුසු බව යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා ස්ථිර කරන ලදී.

ඒ අනුව පක්ෂව හා විපක්ෂව ඡන්දය ප්‍රකාශ කිරීම වෙනුවෙන් බෙදීමකට යන අතර, විවෘත ඡන්දයක් පැවැත්වීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස ගරු සභාපතිතුමන් විසින් ලේකම් වෙත දැනුම් දෙන ලදී.

මෙහිදී, එම යෝජනාවට පක්ෂව සභිකයින් හත් දෙනෙකු ද එනම්,

| | |
|---|---|
| 1. ගරු සභාපති | චමික ජයමිණි විමලසේන මැතිතුමා |
| 2. ගරු නාගරික මන්ත්‍රි | එම්. ජුනයිදීන් මලික්ෂා මැතිතුමා |
| 3. ගරු නාගරික මන්ත්‍රි | එම්. ඩබ්. විමලසිරි මැතිතුමා |
| 4. ගරු නාගරික මන්ත්‍රි | එම්. එම්. රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා |
| 5 ගරු නාගරික මන්ත්‍රිනි | පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය |
| 6. ගරු නාගරික මන්ත්‍රීනී | සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය |
| 7. ගරු නාගරික මන්ත්‍රී | කේ.ජී. පේමදාස මැතිතුමා යන අයත් |

විපක්ෂව සභිකවරුන් නව දෙනෙකුද එනම්,

| | |
|---|---|
| 1. ගරු නාගරික මන්ත්‍රි | ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා |
| 2. ගරු නාගරික මන්ත්‍රි | ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා |
| 3. ගරු නාගරික මන්ත්‍රි | ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා |
| 4. ගරු නාගරික මන්ත්‍රි | එම්. නිමල් කරුණාරත්න මැතිතුමා |
| 5. ගරු නාගරික මන්ත්‍රී | නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා |
| 6. ගරු නාගරික මන්ත්‍රි | එම්. එස්. පී. ගලප්පත්ති මැතිතුමා |
| 7. ගරු නාගරික මන්ත්‍රිනි | ජී. චන්ද්‍රලතා මැතිතුමිය |
| 8. ගරු නාගරික මන්ත්‍රිනි | එම්. ශාන්තිලේඛා මැතිතුමිය |
| 9. ගරු නාගරික මන්ත්‍රිනී | මංගලිකා ඉලංකෝන් මැතිතුමිය ද |

ඡන්දය ප්‍රකාශ කළ අතර, ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා අද දින සභාවට නොපැමිණිනි.

ඒ අනුව රු.10,000.00 ට වැඩි ගෙවීම් සඳහා පූර්ව අනුමැතිය පක්ෂව ඡන්ද 07 ක් ද විපක්ෂව ඡන්ද 09 ක් ද වශයෙන් වැඩි ඡන්ද දෙකකින් පරාජයට පත්විය.

06:01:03 (B) රු.10,000.00 ට වැඩි ගෙවීම් සඳහා ආවරණ අනුමැතිය ලබා ගැනීම.

| **දිනය** | **විස්තරය** | **වවුචර් අංකය** | **චෙක්පත් අංකය** | **මුදල රු.** |
|---|---|---|---|---|
| 2021-12-01 | කේ. චාලට් මිය - කසළ ටෙන්ඩරය (2021-11-16 සිට 2021-11-30 දක්වා) | 01 | 082051 | 299,974.50 |
| 2021-12-02 | ඩයලොග් බ්‍රෝඩ් බෑන්ඩ් නෙට්වර්ක් වෙත ඔක්තෝම්බර් මස ක්ලවුඩ් ඉන්ටනෙට් බිල ගෙවීම | 04 | 082055 | 15,660.00 |
| 2021-12-02 | ඩයලොග් බ්‍රෝඩ් බෑන්ඩ් නෙට්වර්ක් වෙත නොවැම්බර් මස ඉන්ටනෙට් බිල ගෙවීම | 05 | 082055 | 17,821.02 |
| 2021-12-03 | අයි.ආර්.එන්. ඉඹුලෙගම මහතා - මාර්ග පුවරු හා ළමා උද්‍යාන සඳහා පුවරු සැකසීම | 09 | 082059 | 21,800.00 |
| 2021-12-07 | සී/ස ඉඹුල්පේ විවිධ සේවා සමිතිය -2021-10-21 සිට 2021-10-27 දක්වා | 47 | 082089 | 75,347.00 |
| 2021-12-07 | සී/ස ඉඹුල්පේ විවිධ සේවා සමිතිය -2021-11-01 සිට 2021-11-10 දක්වා | 48 | 082089 | 73,794.00 |
| 2021-12-07 | සී/ස ඉඹුල්පේ විවිධ සේවා සමිතිය -2021-10-18 සිට 2021-10-29 දක්වා | 49 | 082089 | 43,908.00 |
| 2021-12-09 | පෙර පාසල් දීමනා | 54-6 | 082103 | 10,000.00 |
| 2021-12-09 | දෛනික වැටුප් | 54-7<br>54-9<br>54-11<br>54-12 | 082103 | 187,656.73 |
| 2021-12-16 | කේ. චාලට් මිය - කසළ ටෙන්ඩරය (2021-12-01 සිට 2021-12-15 දක්වා) | 69 | 082085 | 299,974.50 |
| 2021-12-24<br>හ | බී.කේ.ජේ.එස්. අමරදාස මයා - 2021-11-01 සිට 2021-11-30 දක්වා ඉන්ධන බිල්පත් | 78 | 082157 | 194,921.71 |
| 2021-12-24 | සී/ස ඉඹුල්පේ විවිධ සේවා සමිතිය -2021-11-13 සිට 2021-11-30 දක්වා | 79 | 082158 | 67,168.21 |
| 2021-12-24 | සී/ස ඉඹුල්පේ විවිධ සේවා සමිතිය -2021-11-11 සිට 2021-11-22 දක්වා | 80 | 082158 | 46,720.90 |
| 2021-12-24 | ලංකා විදුලි බල මණ්ඩලය (හෝරස්ථම්භය, සම්පත් පියස, බැංකියවත්ත, වැවවත්ත, පොදු වෙළඳසැල, මහජන පොළ, මුරකුටිය, වැසිකිළි,ප්‍රේක්ෂකාගාරය, බස්නැවතුම්පළ) | 86,91 | 082163<br>082164 | 34,570.00<br>31,758.15 |
| 2021-12-28 | පෝස්ට් මාස්ටර් ජනරාල් | 100 | 082169 | 10,000.00 |
| 2021-12-28 | කුමාරගම ගැමුණු එක්සත් අවමංගල්‍යාධාර සමිතිය | 103 | 082171 | 275,664.19 |

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් මෙම සියලු ගෙවීම් 2021 වර්ෂය සඳහා බව ද කසළ ටෙන්ඩරයේ ගෙවීම් සිදු කර ඇති බව ද පැවසීය.

මෙහි දී කසළ ටෙන්ඩරය සම්බන්ධව කෑ කෝ ගැසීමක් ඇති විය.

මේ සඳහා අවශ්‍ය වන්නේ විවෘත ඡන්දයක්ද රහස්‍ය ඡන්දයක් ද යන්න විමසූ අතර, ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා විවෘත ඡන්දයක් සුදුසු බවට යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා ස්ථිර කරන ලදි.

ඒ අනුව පක්ෂව හා විපක්ෂව ඡන්දය ප්‍රකාශ කිරීම වෙනුවෙන් බෙදීමකට යන අතර, විවෘත ඡන්දයක් පැවැත්වීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස ගරු සභාපතිතුමන් විසින් ලේකම් වෙත දැනුම් දෙන ලදී.

මෙහිදී, එම යෝජනාවට පක්ෂව සභිකයින් හත් දෙනෙකු ද එනම්,

| | |
|---|---|
| 1. ගරු සභාපති | චමික ජයමිණි විමලසේන මැතිතුමා |
| 2. ගරු නාගරික මන්ත්‍රි | එම්. ජුනයිදීන් මලික්ෂා මැතිතුමා |
| 3. ගරු නාගරික මන්ත්‍රි | එම්. ඩබ්. විමලසිරි මැතිතුමා |
| 4. ගරු නාගරික මන්ත්‍රි | එම්. එම්. රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා |
| 5 ගරු නාගරික මන්ත්‍රිනි | පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය |
| 6. ගරු නාගරික මන්ත්‍රිනී | සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය |
| 7. ගරු නාගරික මන්ත්‍රී | කේ.ජී. පේමදාස මැතිතුමා යන අයත් |

විපක්ෂව සභිකවරුන් නව දෙනෙකුද එනම්,

| | |
|---|---|
| 1. ගරු නාගරික මන්ත්‍රි | ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා |
| 2. ගරු නාගරික මන්ත්‍රි | ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා |
| 3. ගරු නාගරික මන්ත්‍රි | ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා |
| 4. ගරු නාගරික මන්ත්‍රි | එම්. නිමල් කරුණාරත්න මැතිතුමා |
| 5. ගරු නාගරික මන්ත්‍රී | නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා |
| 6. ගරු නාගරික මන්ත්‍රි | එම්. එස්. පී. ගලප්පත්ති මැතිතුමා |
| 7. ගරු නාගරික මන්ත්‍රිනි | ජී. චන්ද්‍රලතා මැතිතුමිය |
| 8. ගරු නාගරික මන්ත්‍රිනි | එම්. ශාන්තිලේඛා මැතිතුමිය |
| 9. ගරු නාගරික මන්ත්‍රිනී | මංගලිකා ඉලංකෝන් මැතිතුමිය ද |

ඡන්දය ප්‍රකාශ කළ අතර, ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා අද දින සභාවට නොපැමිණිනි.

ඒ අනුව රු.10,000.00 ට වැඩි ගෙවීම් සඳහා ආවරණ අනුමැතිය සඳහා පක්ෂව ඡන්ද 07 ක් ද විපක්ෂව ඡන්ද 09 ක් ද වශයෙන් වැඩි ඡන්ද දෙකකින් පරාජයට පත්විය. මෙම ගෙවීම් සභාවේ අනිවාර්ය ගෙවීම් බව ද පසුගිය වර්ෂයේ දෙසැම්බර් මස වියදම් බව ද පැවසීය.

06:01:04 2022 පෙබරවාරි මස සභාවේ ගරු සභිකවරුන්ගේ දීමනාව ලෙස රු.270,000.00 ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්. විමලසිරි මැතිතුමා ස්ථිර කරන ලදී.

ඒ සඳහා බෙදීමක් අවශ්‍ය අතර, රහස් ඡන්දයක් අවශ්‍ය බවට ගරු නාගරික මන්ත්‍රී එම්. ජුනයිදීන් මලික්ෂා මැතිතුමා යෝජනා කළ නමුත් ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා විවෘත ඡන්දයක් අවශ්‍ය බවට යෝජනා කරන ලදී.

අනතුරුව රහස් ඡන්දයක් ද විවෘත ඡන්දයක් ද යන්න විමසා බැලීම සඳහා බෙදීමක් අවශ්‍ය බවත් ඒ සඳහා විවෘත ඡන්දයක් අවශ්‍ය බවටත් ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා යෝජනා කළ අතර, එය ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.ඩබ්.පී. ගුණරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඒ අනුව රහස් ඡන්දයක් ද විවෘත ඡන්දයක් ද යන්න සඳහා පක්ෂව හා විපක්ෂව ඡන්දය ප්‍රකාශ කිරීම වෙනුවෙන් බෙදීමකට යන බව පැවසීය.

මෙහිදී, විවෘත ඡන්දය සඳහා පක්ෂව සභිකයින් දස දෙනෙකු ද එනම්,

| | |
|---|---|
| 1. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා |
| 2. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා |
| 3. ගරු නාගරික මන්ත්‍රී | ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා |
| 4. ගරු නාගරික මන්ත්‍රී | එම්. නිමල් කරුණාරත්න මැතිතුමා |
| 5. ගරු නාගරික මන්ත්‍රී | නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා |
| 6. ගරු නාගරික මන්ත්‍රී | එම්. එස්. පී. ගලප්පත්ති මැතිතුමා |
| 7. ගරු නාගරික මන්ත්‍රිනි | ජී. චන්ද්‍රලතා මැතිතුමිය |
| 8. ගරු නාගරික මන්ත්‍රිනි | එම්. ශාන්තිලේඛා මැතිතුමිය |
| 9. ගරු නාගරික මන්ත්‍රිනී | මංගලිකා ඉලංකෝන් මැතිතුමිය |
| 10. ගරු නාගරික මන්ත්‍රිනී | තරංගනී සමරසේකර මැතිතුමිය ද |

විපක්ෂව සභිකවරුන් දෙදෙනෙකුද එනම්,

| | |
|---|---|
| 1. ගරු නාගරික මන්ත්‍රී | එම්. ජුනයිදීන් මලික්ෂා මැතිතුමා |
| 2. ගරු නාගරික මන්ත්‍රී | එම්. ඩබ්. විමලසිරි මැතිතුමා ද |

ඡන්දයෙන් වැළකී සිටි සභිකවරුන් තුන් දෙනෙකු ද

| | |
|---|---|
| 1. ගරු සභාපති | චමික ජයමිණි විමලසේන මැතිතුමා |
| 2. ගරු නාගරික මන්ත්‍රිනී | සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය |

3. ගරු නාගරික මන්ත්‍රී කේ.ජී. පේමදාස මැතිතුමා යන අයත්

ඡන්දය ප්‍රකාශ කළ අතර, ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමා අද දින සභාවට නොපැමිණි අතර, ගරු නාගරික මන්ත්‍රී එම්. එම්. රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා සභා ගර්භයේ නොසිටියේය.

ඒ අනුව 2022 පෙබරවාරි මස සභාවේ ගරු සභිකවරුන්ගේ දීමනාව ලෙස රු.270,000.00 ගෙවීම සඳහා විවෘත ඡන්දයක් පැවැත්වීමට පක්ෂව ඡන්ද 10 ක් ද විපක්ෂව ඡන්ද 02 ක් ද වැළකී සිටීම් 03 ක් ද වශයෙන් වැඩි ඡන්ද අටකින් පරාජයට පත්විය.

මෙහි දී 2022 පෙබරවාරි මස සභාවේ ගරු සභිකවරුන්ගේ දීමනාව ලෙස රු.270,000.00 ගෙවීමට පක්ෂව හා විපක්ෂව ඡන්දය ප්‍රකාශ කිරීම වෙනුවෙන් බෙදීමකට යන අතර, විවෘත ඡන්දයක් පැවැත්වීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස ගරු සභාපතිතුමන් විසින් ලේකම් වෙත දැනුම් දෙන ලදී.

මෙහිදී, සභික දීමනාව ගෙවීම සඳහා වන යෝජනාවට පක්ෂව සභිකයින් තුන් දෙනෙකු ද එනම්,

1. ගරු නාගරික මන්ත්‍රී එම්. ජුනයිදීන් මලික්ෂා මැතිතුමා
2. ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ්. විමලසිරි මැතිතුමා
3. ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය ද

විපක්ෂව සභිකවරුන් දස දෙනෙකුද එනම්,

1. ගරු නාගරික මන්ත්‍රී ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා
2. ගරු නාගරික මන්ත්‍රී ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා
3. ගරු නාගරික මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා
4. ගරු නාගරික මන්ත්‍රී එම්. නිමල් කරුණාරත්න මැතිතුමා
5. ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා
6. ගරු නාගරික මන්ත්‍රී එම්. එස්. පී. ගලප්පත්ති මැතිතුමා
7. ගරු නාගරික මන්ත්‍රිනි ජී. චන්ද්‍රලතා මැතිතුමිය
8. ගරු නාගරික මන්ත්‍රිනි එම්. ශාන්තිලේඛා මැතිතුමිය
9. ගරු නාගරික මන්ත්‍රිනී මංගලිකා ඉලංකෝන් මැතිතුමිය
10. ගරු නාගරික මන්ත්‍රිනී තරංගනී සමරසේකර මැතිතුමිය ද

ඡන්දයෙන් වැළකී සිටි සභිකවරුන් තුන් දෙනෙකු ද

1. ගරු සභාපති චමික ජයමිණි විමලසේන මැතිතුමා
2. ගරු නාගරික මන්ත්‍රී කේ.ජී. පේමදාස මැතිතුමා යන අයත්

ඡන්දය ප්‍රකාශ කළ අතර, ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමා අද දින සභාවට නොපැමිණි අතර, ගරු නාගරික මන්ත්‍රී එම්. එම්. රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා සභා ගර්භයේ නොසිටියේය.

ඒ අනුව 2022 පෙබරවාරි මස සභාවේ ගරු සභිකවරුන්ගේ දීමනාව ලෙස රු.270,000.00 ගෙවීම සඳහා පක්ෂව ඡන්ද 03 ක් ද විපක්ෂව ඡන්ද 10 ක් ද වැළකී සිටීම් 02 ක් ද වශයෙන් වැඩි ඡන්ද හතකින් පරාජයට පත්විය.

06:01:05 2022-01-11 දින සිට 2022 පෙබරවාරි මස සභාව පැවැත්වෙන දින දක්වා සෞඛ්‍ය සේවා සඳහා වියදම් ඇස්තමේන්තුව වන රු. 374,099.50 ක මුදල සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

(2021-12-10 දින සිට 2022-01-08 දක්වා වියදම රු. 91,830.00)

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්. විමලසිරි මැතිතුමා ස්ථිර කරන ලදී.

මෙහි දී ගරු සභාපතිතුමන් අදහස් දක්වමින් වැසිකිළි පිරිසිදු කිරීම, කසළ ඉවත් කිරීම හා සෞඛ්‍ය සේවා සඳහා වන වියදම් මෙහි අන්තර්ගත බව පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා අදහස් දක්වමින් පැවසුවේ අයවැය පරාජය වීම තුළ අද දින සභාව නීත්‍යානුකූල නොවන බැවින් බෙදීමක් ඉල්ලා සිටින බවයි.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් සභාව තුළ සහ මහජනතාව වෙනුවෙන් පවතින යෝජනා වෙන වෙනම ඉදිරිපත් කරමින් සභාවේ තීරණයක් ගැනීමට තමන් කටයුතු කළ නමුත් දිගින් දිගටම තෝරා බේරා ගැනීමකින් තොරව විරුද්ධ වන බැවින් 06:01:05 යෝජනාවේ සිට 08:02:01 යෝජනාව දක්වා සම්පූර්ණ වශයෙන් බෙදීමකට යාම සුදුසු බව යෝජනා කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා පැවසුයේ සභාව කල් තබා නැවත දිනයක පැවැත්වීමට යෝජනා කරන බවයි.

ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා, මෙම සභාව පිළිනොගන්නේ නම් ගරු මන්ත්‍රීවරුන් රැඳී සිටීමේ තේරුමක් නොමැති බව පැවසීය.

අනතුරුව කෑ කෝ ගැසීමක් ඇති විය.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් පවසා සිටියේ සභාව පවත්වාගෙන යාම හා මහජනතාවට සේවා හා පහසුකම් සැලසීම තම වගකීම බව ද ගරු නාගරික මන්ත්‍රීවරුන් පිරිසකගේ හැසිරීම හා මානසිකත්වය පිළිබඳව සියලු දෙනාම දන්නා බව ද මෙම කණ්ඩායමේ කොටසක් කොන්ත්‍රාත් මානසිකත්වයෙන් සිටින බවට එම කණ්ඩායමේ නායකයෙක්ම පැවසූ බව ද 2021 වර්ෂයේ දෙසැම්බර් මස දී 2022 ජනවාරි මාසයේ සිට සභාව පවත්වන දිනය තීරණය කළ බව ද පනතට හා ව්‍යවස්ථාවට අනුව තමන් කටයුතු කළ අතර, සභාව නීත්‍යානුකූල නොමැති නම් ඒ බව නීත්‍යානුකූලව දැනුම් දිය යුතුව තිබූ බව ද සභාවක් කැඳවීමේ බලය සභාපතිවරයාට පමණක් ඇති බව ද පවසන ලදී.

06:01:06 2022 ජනවාරි මස සභාවේ නිළධාරීන්ගේ අතිකාල හා ගමන් වියදම් ඇස්තමේන්තුව සඳහා රු300,000.00 ක මුදලක් ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.
(2021 දෙසැම්බර් මස අතිකාල හා ගමන් වියදම් රු. 259,007.35 )

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කළ අතර, ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා ස්ථිර කරන ලදී.

06:01:07 2022-01-11 දින සිට 2022 පෙබරවාරි මස සභාව පැවැත්වෙන දින දක්වා සභාවේ සංග්‍රහ වියදම් ලෙස රු.50,000.00 ක මුදලක් වියදම් දැරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

(2021 දෙසැම්බර් මස සභාවේ සංග්‍රහ වියදම් රු. 65,015.00)

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කළ අතර, ගරු නාගරික මන්ත්‍රිනී තරංගනී සමරසේකර මැතිතුමිය ස්ථිර කරන ලදී.

06:01:08 2022-01-11 දින සිට 2022 පෙබරවාරි මස සභාව පැවැත්වෙන දින දක්වා සභාවේ වාහනවල හදිසි අලුත්වැඩියා කටයුතු සඳහා රු.300,000.00 මුදලක් වියදම් කිරීම හා ඒ සඳහා ආවරණ අනුමැතියට යටත්ව මුදල් ගෙවීම වෙනුවෙන් සභා අනුමැතිය ලබා ගැනීම.

(2021 දෙසැම්බර් මස සභාවේ හදිසි අලුත්වැඩියා කටයුතු සඳහා වැය වූ මුදල රු.122,755.00)

- RC 1118, RB 4786, HF 8558 යන ට්‍රැක්ටර් රථවල වහල අලුත්වැඩියා කිරීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය ලබා ගැනීම වෙනුවෙන් පී.එම්.කේ. හාඩ්වෙයාර් වෙත රු.10,585.00, රු. 17,085.00 හා රු. 17,085.00 ක් වශයෙන් මුදල් ගෙවීම

- RC 1118, RB 4786, HF 8558 යන ට්‍රැක්ටර් රථවල වහලයෙහි ටෙන්ඩ් එක ගැසීම වෙනුවෙන් ලාල් කුෂන් වෙත එකක් රු. 26,000.00 බැගින් රු. 78,000.00 ක මුදලක් ගෙවීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කළ අතර, ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා ස්ථිර කරන ලදී.

06:01:09 2021-12-10 දින සිට 2022 ජනවාරි මස සභාව පැවැත්වෙන දින දක්වා සභාවේ යන්ත්‍ර සූත්‍රවල හදිසි අලුත්වැඩියා කටයුතු සඳහා රු.75,000.00 ක මුදලක් වියදම් කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

(2021 නොවැම්බර් මස සභාවේ යන්ත්‍ර සූත්‍රවල හදිසි අලුත්වැඩියා කටයුතු සඳහා වියදම් නොවුණි)

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කළ අතර, ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය ස්ථිර කරන ලදී.

06:01:10 2022 ජනවාරි මස ගෙවිය යුතු දේශීය ණය සහ සංවර්ධන අරමුදල මඟින් බස්නැවතුම්පල සහිත වෙළෙඳ සංකීර්ණය ඉදිකිරීම සඳහා ලබා ගත් ණය වාරිකය ලෙස රු.769,680.36 මුදලක් ද, වැසි ජල කාණු පද්ධතිය ඉදි කිරීම වෙනුවෙන් ලබා ගත් ණය වාරිකය ලෙස රු.202,918.84 ක මුදලක් ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කළ අතර, ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා ස්ථිර කරන ලදී.

06:01:11 2021 දෙසැම්බර් මාසය සඳහා කාර්යසාධන ණය රු. 800,000.00 කට යටත්ව ලබා දීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කළ අතර, ගරු නාගරික මන්ත්‍රීනී තරංගනී සමරසේකර මැතිතුමිය ස්ථිර කරන ලදී.

06:01:12 56-1906 කෘෘ කැබ් රථයේ ගියර් කනෙක්ටර් අලුතින් දැමීම සහ ටයර් රෝඩ් අලුත්වැඩියා කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

06:01:13 HF 7899 ජේසීබී යන්ත්‍රයේ පහත අලුත්වැඩියාවන් සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

- පසුපස බ්‍රම් එකේ ජැක් සීල් එකෙහි ඔයිල් කාන්දුව
- පසුපස බකට් එකේ හෝස් එකෙහි ඔයිල් කාන්දුව
- එක්ට්‍රා ඩිස් එකෙහි පිං එක අලුත්වැඩියාව
- ඇතුලත ජැක් එක, ඩීසල් ටැංකියේ හෝස් එක, හෙඩ් ලයිට්, මඩ් ගාඩ් අලුත්වැඩියා කිරීම

06:01:14 67-1565 , 46-4907 ට්‍රේලර් අලුත්වැඩියාව සහ RC 1107, RE 2600, RC 8183, RD 8000, HF 8952 යන ට්‍රැක්ටර් රථවල වහලය අලුත්වැඩියා කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කළ අතර, ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා ස්ථිර කරන ලදී.

06:01:15 GK 1483 ට්‍රැක්ටර් රථය සඳහා 90 AMP බැටරියක් ලබා ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කළ අතර, ගරු නාගරික මන්ත්‍රීනි සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය ස්ථිර කරන ලදී.

06:01:16 2022 ජනවාරි මස සිට ජූනි 30 දක්වා සභාව සතු වාහන සේවා කිරීම සඳහා සභාවේ වාහන සේවා සඳහා ලියාපදිංචි රිෂානා සර්විස් ආයතනයෙන් හා කේ.ජී.ඉංජිනියරින් ඇන්ඩ් කේ.ජී. ඔටෝ ක්ලීන් ආයතනය වෙතින් ඉදිරිපත් කර ඇති මිල ගණන් අනුමත කර අදාල සේවාව ලබා ගැනීම සඳහා සභා අනුමත කර ගැනීම

06:01:17 බස් රථ ටෙන්ඩර්ය සම්බන්ධයෙන් වන ගාස්තුවලින් 2022 වර්ෂයේ පහත දිනයන් නිදහස් කර දීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

- 2022-02-04
- 2022 දෙවන මස 13,14,15,16,17 යන දිනයන්

- 2022-05-01 මැයි 01
- 2022-12-25 දින
- 2022 වසරේ සෑම මසකම පෝය දින
- 2022 වසරේ මැයි මස වෙසක් පෝය දින හා ජූනි මස පෝය දින

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කළ අතර, ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා ස්ථිර කරන ලදී.

06:01:18 2022 වර්ෂයේ ජනවාරි සිට පෙබරවාරි මස මහ සභාව පැවැත්වෙන දිනය දක්වා වැසි ජල කාණු නඩත්තුව සඳහා වූ ඇස්තමේන්තු මුදල වන රු. 126,583 ක මුදල සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

06:01:19 2022 වර්ෂයේ ජනවාරි සිට පෙබරවාරි මස මහ සභාව පැවැත්වෙන දිනය දක්වා මාර්ග නඩත්තුව සඳහා වූ ඇස්තමේන්තු මුදල වන රු. 592,208.00 ක මුදල සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කළ අතර, ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා ස්ථිර කරන ලදී.

06:01:20 නාගරික සංවර්ධන නිවාස ව්‍යාපෘතිය යටතේ වැසි ජල කාණු පද්ධතිය ඉදි කිරීම වෙනුවෙන් සහ නාගරික සංවර්ධන අඩු ආදායම් නිවාස ව්‍යාපෘතිය යටතේ නව බස්නැවතුම්පොළ සහිත වෙළඳ සංකීර්ණය ඉදි කිරීම වෙනුවෙන් දේශීය ණය සහ සංවර්ධන අරමුදලින් ලබා ගත් ණය මුදල් සඳහා 2022 වර්ෂයේ ණය වාරික වෙනුවෙන් වැය වන මුදල වන රු. 972,599.20 ක් සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කළ අතර, ගරු නාගරික මන්ත්‍රිනී තරංගනී සමරසේකර මැතිතුමිය ස්ථිර කරන ලදී.

06:01:21 2022 වර්ෂය සඳහා ජල බිල්පත්, විදුලි බිල්පත්, දුරකතන බිල්පත් ආවරණ අනුමැතියට යටත්ව ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම. මාසික දළ ඇස්තමේන්තුව රු. 146,990.00

06:01:22 2022 වර්ෂය සඳහා බළන්ගොඩ මූලික රෝහලේ සූතිකාගාරයෙන් හා ශල්‍යාගාරයෙන් ඉවත දමන වැදෑ මහ හා මළ සිරුරු කොටස් වල දැමීමට රජය සතු සුසාන භූමියකින් ඉඩ කොටසක් ලබා ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කළ අතර, ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය ස්ථිර කරන ලදී.

06:01:23 2022-01-11 සිට 2022-02-11 දක්වා කාර්යාලයීය අවශ්‍යතා වන ලිපි ද්‍රව්‍ය සඳහා වියදම් ඇස්තමේන්තුව වශයෙන් රු. 163,071.00 ක් සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කළ අතර, ගරු නාගරික මන්ත්‍රිනී තරංගනී සමරසේකර මැතිතුමිය ස්ථිර කරන ලදී.

06:01:24 ලේඛනාගාරයේ ලිපිගොනු ස්කෑන් කිරීමේ වැඩසටහනේ දත්ත Back up කිරීම සඳහා 1 TB External Hard Disk ලබා ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

06:01:25 නගර සභා බල ප්‍රදේශය තුල මස් විකිණීමේ ස්ථාන පවත්වාගෙන යාම සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථාවක් ප්‍රකාශයට පත් කර ඇති අතර, මෙම වෙළඳාම සඳහා වෙළඳ බලපත්‍ර නිකුත් කිරීම සම්බන්ධයෙන් සභාවේ උපදෙස් ලබා ගැනීම හා ඒ සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කළ අතර, ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය ස්ථිර කරන ලදී.

06:01:26 නව බස්නැවතුම්පළ බී 11 කඩ කාමරය එම්.වයි. රිෆාස් මොහොමඩ් යන අය විසින් අබ්දුල් රසාක් මොහොමඩ් අසීම් යන අයට පැවරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

06:01:27 සී 41 කඩ කාමරය පී.ඒ. ඇල්බට් කුරේ යන අය විසින් ඩී.එම් නිෂාධ රුක්මාල් යන අය වෙත අතුරු බදු දීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කළ අතර, ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය ස්ථිර කරන ලදී.

06:01:28 කාර්යාලයීය ගොඩනැගිල්ල තීන්ත ආලේප කිරීම වෙනුවෙන් පහත සඳහන් ද්‍රව්‍ය ලබා ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

- W/s enamel (water) 10 L
- W/S emulsion 40 L
- Floor paint 4 L
- Tinner 6 L
- Wall Piller 1 L
- 4" paint Brush 1
- 5" paint Brush 10
- Sand paper 10

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කළ අතර, ගරු නාගරික මන්ත්‍රීනී තරංගනී සමරසේකර මැතිතුමිය ස්ථිර කරන ලදී.

06:01:29 2022 වර්ෂයේ ජනවාරි මස සිට පෙබරවාරි මස සභාව පැවැත්වෙන දින දක්වා වීථි පහන් නඩත්තු කිරීම වෙනුවෙන් අදාල ද්‍රව්‍ය හා උපාංග ලබා ගැනීම සඳහා වියදම් ඇස්තමේන්තුව වන රු. 66,600.00 ක මුදල සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

06:01:30 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 18 වගන්තිය යටතේ විගණන ගාස්තු වන රු. 538,500.00 ක මුදලක් ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කළ අතර, ගරු නාගරික මන්ත්‍රීනී තරංගනී සමරසේකර මැතිතුමිය ස්ථිර කරන ලදී.

06:01:31 පොදු වෙළඳසැල අංක 09 හා 10 හැර පහත සඳහන් මාළු කඩ ටෙන්ඩර් කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

i. පොදු වෙළඳසැල අංක 11 මාළු කඩ කාමරය
ii. පොදු වෙළඳසැල අංක 12 මාළු කඩ කාමරය
iii. පොදු වෙළඳසැල අංක 14 මාළු කඩ කාමරය
iv. පොදු වෙළඳසැල අංක 18 මාළු කඩ කාමරය

06:01:32 2022-03-04 දින විශ්‍රාම යාමට නියමිත එස්.ආර්.වනිගසූරිය මහතාගේ කොන්ත්‍රාත් සේවා කාලය ස්ථිර සේවා කාලයට එකතු කිරීම සඳහා සේවක අර්ථසාධක අරමුදලෙන් සමුච්චිත අරමුදලෙහි තැන්පත් කළ 60% ක ප්‍රමාණය වන රු. 87,363.85ක මුදල විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කළ අතර, ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය ස්ථිර කරන ලදී.

06:01:33 රට තුළ පවතින කොඩිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් 2021-05-01 දින සිට 2021-10-31 දින දක්වා බස් රථ ධාවනය අඩු වූ බැවින් අය කිරීමට අපේක්ෂා කරනු ලබන මුදල අදාල ටෙන්ඩර්කරුගෙන් අය කර ගැනීම සඳහා 2022 ජනවාරි මස සිට මාස හතරක කාලයක් ලබා දීමට සභා අනුමැතිය ලබා ගැනීම

06:01:34 රට තුළ පවතින කොඩිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් 2021 මැයි 21 සිට සැප්තැම්බර් 31 දක්වා කාල සීමාව තුළ රථ වාහන පැමිණීමේ අඩුවීමක් පැවතුන බැවින් එම කාලයට හා ඔක්තෝම්බර් මස සඳහා සහනයක් අදාල ටෙන්ඩර්කරුට ලබා දීම වෙනුවෙන් සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කළ අතර, ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා ස්ථිර කරන ලදී.

06:01:35 පදික කඩ කාමර අංක 185/19 ලබා ගෙන ඇති බී. සිරිපාල මහතා මියගොස් ඇති බැවින් ඔහුගේ බිරිඳ වන ඉන්ද්‍රා අනුලා ගීතාංජලී මහත්මියගේ නමට එම කඩය පවරා දීමට සභා අනුමැතිය ලබා ගැනීම

06:01:36 බළන්ගොඩ නගර සභාව මඟින් 2018/2019, 2019/2020, 2020/2021 අධ්‍යයන වර්ෂ සඳහා විශ්ව විද්‍යාල ශිෂ්‍යත්ව ලබා ගැනීමට අයදුම්පත්‍ර භාර දුන් ශිෂ්‍යත්වලාභීන්ගේ සංශෝධිත නාම ලේඛනය සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කළ අතර, ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා ස්ථිර කරන ලදී.

06:01:37 අනඳමෙත්ගම මැද පාර පිළිසකර කර ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කළ අතර, ගරු නාගරික මන්ත්‍රිනී තරංගනී සමරසේකර මැතිතුමිය ස්ථිර කරන ලදී.

06:01:38 2022 ජනවාරි මාසය සඳහා කර්මාන්ත අංශයේ කොන්ත්‍රාත් පදනමේ කම්කරු වියදම් ඇස්තමේන්තුව වන රු. 538,750.00 ක මුදල සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

06:01:39 2022 ජනවාරි/පෙබරවාරි මස කර්මාන්ත අංශයේ නඩත්තු සඳහා ද්‍රව්‍ය හා වියදම් ඇස්තමේන්තුව වන රු. 146,900.00 ක මුදල සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කළ අතර, ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා ස්ථිර කරන ලදී.

06:01:40 බළන්ගොඩ නගර සීමාව තුළ පිහිටි අනඳමෙත්ගම ප්‍රජා ශාලාව අසලින් වම් පසට ඇති අතුරු මාර්ගය අබලන්ව ඇති බැවින් එය නඩත්තු කිරීමට සහ මාර්ගය සුද්ධ පවිත්‍ර කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

06:01:41 "බණ්ඩාරකුඹුර, උයන්ගහවත්ත, මහ උයන්වත්ත" නැමැති ඉඩම අත්පත් කර ගැනීමට හා ඒ සඳහා රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවෙන් සඳහන් කර ඇති සම්පූර්ණ මුදල වන රු. 1,250,000.00 ක මුදල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තැන්පත් කිරීමට සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කළ අතර, ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා ස්ථිර කරන ලදී.

06:01:42 2021 ඔක්තෝම්බර් ජාතික කියවීම් මාසයේ ත්‍යාග සහ සහතික පත් ප්‍රදානෝත්සවය වෙනුවෙන් වියදම් ඇස්තමේන්තුව වන රු. 92,000.00 ක මුදල සඳහා සභා අනුමැතිය ලබා ගැනිම

06:01:43 කුමාරගම වසමේ අංක 620071 කැඩැස්තර සිතියමේ කලාප 12 හි කැබලි අංක 131 වන හපුගහහේන ඉඩම සහ තුඹගොඩ වසමේ අංක 620077 දරණ කැඩැස්තර සිතියමේ කලාප 08 හි කැබලි අංක 118 වන බෝගහහේන ඉඩම යන ඉඩම් කොටස් නගර සභාව වෙත පවරා ගැනීම සඳහා අවශ්‍ය පිඹුරු (බිම් කට්ටි සැලසුම්) සකසා ගැනීමට සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කළ අතර, ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා ස්ථිර කරන ලදී.

06:01:44 2022 වර්ෂයේ මහ සභාව සෑම මසකම දෙවන අඟහරුවාදා පැවැත්වෙන අතර, පහත සඳහන් දිනයන් නිවාඩු දිනයන් වන බැවින් එම මාසයට අදාල මහ සභාව පැවැත්වෙන දිනය තීරණය කිරීම හා ඒ සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

- අප්‍රේල් 12
- ජූනි 14

06:01:45 බලංගොඩ නගර සභා තානායමේ ටෙන්ඩර් කාලය 2022/02/28 දිනෙන් අවසන් වන බැවින් තානායම නැවත ටෙන්ඩර් කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනිම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කළ අතර, ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා ස්ථිර කරන ලදී.

06:01:46 බලංගොඩ නගර සභා තානායම ටෙන්ඩර් කිරීමට පෙර අළුත්වැඩියා කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනිම.

**07. මිල ගණන් අනුමත කිරීම හා මුදල් ගෙවීම**

07:01 බොබ් කැට් යන්ත්‍රය අලුත්වැඩියා කිරීම සඳහා C-COM Equipment PVT Limited වෙතින් ඉදිරිපත් කර ඇති රු. 961,788.60 ක ඇස්තමේන්තුව අනුමත කර අදාල සේවාව ලබා ගැනීම හා මුදල් ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කළ අතර, ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා ස්ථිර කරන ලදී.

07:02 ZA 5326 මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය පූර්ණ සේවා කිරීම සඳහා ඇවන්ස්මාර්ට් ඉංජිනියරින් ආයතනය වෙතින් ඉදිරිපත් කර ඇති රු.269,732.67 ක ඇස්තමේන්තුව අනුමත කර අදාල සේවාව ලබා ගැනීම හා මුදල් ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

07:03 පිළිගැනීමේ කවුළුවේ තිබෙන Q 16377 ඡායා පිටපත් යන්ත්‍රය සඳහා Wisdom Computer Technologies ආයතනයෙන් එකක් රු. 11,350.00 බැගින් Mp 2014 HS Toner පහක් මිල දී ගැනීම සඳහා රු. 56,750.00 ක මුදල අනුමත කර ගැනීම හා මුදල් ගෙවීම

07:04 සෞඛ්‍ය අංශයේ කසළ එකතු කිරීම සඳහා අත් කරත්ත 05ක් අලුත්වැඩියා කිරීම හා ඒ සඳහා අවශ්‍ය ද්‍රව්‍ය වෙනුවෙන් PMK හාඩ්වෙයාර් වෙතින් ඉදිරිපත් කර ඇති රු. 51,806.00 ක ඇස්තමේන්තුව අනුමත කිරීම හා මුදල් ගෙවීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කළ අතර, ගරු නාගරික මන්ත්‍රීනී තරංගනී සමරසේකර මැතිතුමිය ස්ථිර කරන ලදී.

**08. මන්ත්‍රී යෝජනා**

**08:01 ගරු නාගරික මන්ත්‍රීනී තරංගනී සමරසේකර මැතිතුමිය**

08:01:01 ශෛලතලාරාම මාර්ගයේ උඩහගම මාර්ගයේ අඩියක පැති බැම්ම සහිතව නඩත්තු කිරීම

08:01:02 අනඳමෙත්ගම බණ්ඩාරවත්ත මහතාගේ නිවෙස්වලට යන මාර්ගය නඩත්තු කිරීම

08:01:03 බුද්ධ ජයන්ති මාර්ගයේ සන්නිවේදන කුළුණ අසල ඇති මාර්ගයේ දෙපස පිහිටා ඇති කළුගල් කැබලි ඉවත් කිරීම හා බුද්ධ ජයන්ති විද්‍යාලය දක්වා ඇති කාණුව ගොඩ දැමීම

**08:02 ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.ඩබ්.පී. ගුණරත්න මැතිතුමා**

08:02:01 වෙට්නෝල් මාර්ගය හා ටෝනි මහතාගේ නිවස මාර්ගය අලුත්වැඩියා කිරීම (නඩත්තු)

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් ගෙනෙන ලද සියලුම යෝජනා ප්‍රතික්ෂේප කරමින් බෙදීමක් ඉල්ලා සිටින බව ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ. ප්‍රේමකුමාර මැතිතුමා පවසන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා ස්ථිර කරන ලදී.

මේ සඳහා අවශ්‍ය වන්නේ විවෘත ඡන්දයක්ද රහස්‍ය ඡන්දයක් ද යන්න විමසූ අතර, ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා විවෘත ඡන්දයක් සුදුසු බවට යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.ඩබ්.පී. ගුණරත්න මැතිතුමා ස්ථිර කරන ලදී.

ඒ අනුව 06:01:05 සිට 08:02:01 දක්වා සියලුම යෝජනාවලට පක්ෂව හා විපක්ෂව ඡන්දය ප්‍රකාශ කිරීම වෙනුවෙන් බෙදීමකට යන අතර, විවෘත ඡන්දයක් පැවැත්වීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස ගරු සභාපතිතුමන් විසින් ලේකම් වෙත දැනුම් දෙන ලදී.

මෙහිදී, එම යෝජනාවට පක්ෂව සභිකයින් හත් දෙනෙකු ද එනම්,

| | |
|---|---|
| 1. ගරු සභාපති | චමික ජයමිණි විමලසේන මැතිතුමා |
| 2. ගරු නාගරික මන්ත්‍රී | එම්. ජුනයිදීන් මලික්ෂා මැතිතුමා |
| 3. ගරු නාගරික මන්ත්‍රී | එම්. ඩබ්. විමලසිරි මැතිතුමා |
| 4. ගරු නාගරික මන්ත්‍රී | එම්. එම්. රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා |
| 5 ගරු නාගරික මන්ත්‍රිනි | පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය |
| 6. ගරු නාගරික මන්ත්‍රීනී | සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය |
| 7. ගරු නාගරික මන්ත්‍රී | කේ.ජී. පේමදාස මැතිතුමා යන අයත් |

විපක්ෂව සභිකවරුන් නව දෙනෙකුද එනම්,

| | |
|---|---|
| 1. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා |
| 2. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා |
| 3. ගරු නාගරික මන්ත්‍රී | ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා |
| 4. ගරු නාගරික මන්ත්‍රී | එම්. නිමල් කරුණාරත්න මැතිතුමා |
| 5. ගරු නාගරික මන්ත්‍රී | නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා |
| 6. ගරු නාගරික මන්ත්‍රී | එම්. එස්. පී. ගලප්පත්ති මැතිතුමා |
| 7. ගරු නාගරික මන්ත්‍රිනි | ජී. චන්ද්‍රලතා මැතිතුමිය |
| 8. ගරු නාගරික මන්ත්‍රිනි | එම්. ශාන්තිලේඛා මැතිතුමිය |
| 9. ගරු නාගරික මන්ත්‍රිනී | මංගලිකා ඉලංකෝන් මැතිතුමිය ද |

ඡන්දය ප්‍රකාශ කළ අතර, ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා අද දින සභාවට නොපැමිණිනි.

ඒ අනුව 06:01:05 සිට 08:02:01 දක්වා සියලුම යෝජනා තමන් විසින් එකින් එක ඉදිරිපත් කළ අතර, එම යෝජනා ස්ථිර කිරීමෙන් පසුව එම යෝජනාවලට විරුද්ධව බෙදීමක් ඉල්ලීමෙන් අනතුරුව සභාව පවත්වාගෙන යාමට අවශ්‍ය කරන යෝජනාවලට පක්ෂව ඡන්ද 07 ක් ද විපක්ෂව ඡන්ද 09 ක් ද වශයෙන් වැඩි ඡන්ද දෙකකින් 06:01:05 සිට 08:02:01 දක්වා සියලුම යෝජනා ප්‍රතික්ෂේප කර ඇති බව ගරු සභාපතිතුමන් පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා මාළු කඩ ටෙන්ඩර් කිරීම සම්බන්ධව එවා ඇති ලිපිය පිළිබඳව පැහැදිලි කිරීමක් කරන ලෙස ලේකම්තුමියගෙන් ඉල්ලා සිටින ලදී.

මෙහි දී ගරු සභාපතිතුමා අදහස් දක්වමින් රත්නපුර දිස්ත්‍රික් විගණන කමිටුවේ දී මේ සම්බන්ධව සාකච්ඡා වූ බව ද ඉදිරියේ දී ගරු මන්ත්‍රීවරුන් වෙත විගණනයක් සිදු කළ හැකි බව ද පැවසූ අතර, ලේකම්තුමියගෙන් කරුණු පැහැදිලි කර ගැනීම සඳහා මහ සභාව කාරක සභාවක් බවට පත් කිරීමට යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා ස්ථිර කරන ලදී.

ලේකම්තුමියගේ කරුණු පැහැදිලි කර ගැනීමෙන් අනතුරුව කාරක සභාව මහ සභාවක් බවට පත් කිරීමට ගරු සභාපතිතුමන් විසින් කරන ලද යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා ස්ථිර කරන ලදී.

**09. කාරක සභා වාර්තා, කමිටු වාර්තා සළකා බැලීම.**

**10. ආදායම් වියදම් වාර්තා සළකා බැලීම.**

2021-12-01 සිට 2021-12-31 දක්වා ආදායම් හා වියදම්

| | |
|---|---|
| පුනරාවර්තන ලැබීම් | 10,675,455.36 |
| වෙනත් ලැබීම් | 3,255,273.45 |
| මුලු ලැබීම් | 13,930,728.81 |
| පුනරාවර්තන වියදම් | 10,380,722.88 |
| වෙනත් වියදම් | 1,864,106.69 |
| මුලු වියදම් | 12,244,829.57 |

2021-12-01 සිට 2021-12-31 දක්වා ඉන්ධන වාර්තාව

| වාහන අංකය | මුළු එකතුව |
|---|---|
| 56-1906 | 9,546.00 |
| | 5,203.00 |
| 227-5020 | 32,967.00 |
| | 21,054.00 |
| 226-7521 | 12,099.00 |
| | 5,445.00 |
| BC-0005 | 25,700.00 |
| GC 0001 | 8,110.00 |
| | 3,363.00 |
| FP 0002 | 385.00 |
| ZA 5039 | 11,100.00 |
| | 11,374.00 |
| LL - 7688 | 7,260.00 |
| | 0.00 |
| JD-4684 | 1,256.00 |
| | 1,416.00 |
| LL-2110 | 6,268.00 |
| ND-5124 | 19,092.00 |
| | 15,488.00 |
| | 0.00 |
| PF-4006 | 38,160.00 |
| | 4,830.42 |
| QL-2901 | 6,280.00 |
| | 1,416.00 |
| RD 8000 | 12,243.30 |
| RB 4786 | 16,905.30 |
| | 9,317.00 |
| RE 2600 | 19,479.00 |
| | 10,164.00 |
| RC8183 | 12,519.80 |
| | 12,826.00 |
| 37-7933 | 4,662.00 |
| RD8240 | 19,935.60 |
| | 9,196.00 |
| SDRR0013 | 555.00 |
| VI 1833 | 1,770.00 |
| RC 1118 | 11,222.10 |
| | 12,100.00 |
| HF 7899 | 41,958.00 |
| | 0.00 |
| | 0.00 |
| CSM0009 | 531.00 |
| UQ 1933 | 1,770.00 |
| එකතුව | **444,966.52** |

**11. ඇස්තමේන්තු අනුමත කිරීම**

**12. පෞද්ගලික මන්ත්‍රී පැහැදිලි කිරීම්**

**ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා අදහස් දක්වමින් 2022 වර්ෂයේ පළමු සභාව නීත්‍යානුකූල නොවන බව විපක්ෂ කණ්ඩායම විසින් පවසන නමුත් සෑම මසකම දෙවන අඟහරුවාදා සභාව පැවැත්වීමට තීරණය කළ බැවින් ගරු සභාපතිතුමා විසින් පවත්වන්නට යෙදුණු බව ද සභාව නොපවත්වන ලෙස ලියවිල්ලක් නොමැති අතර, 2017 වර්ෂයේ ගරු සභාපතිතුමාව පත් කිරීමට ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ඡන්දය ලබා දුන් බව ද දේශපාලන ඉතිහාසය දෙස බැලීමේ දී නැවතත් යම් කිසි ප්‍රශ්නයක් ඇති වී විශේෂයෙන් හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ආණ්ඩුවෙන් ඉවත් වී පොදු ජන එක්සත් පෙරමුණ වෙත ඡන්දය ලබා නොදෙන ලෙස පැවසුවහොත් නව සභාපතිවරයෙක් පත් කරන අවස්ථාවේ දී ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ තීරණය කුමක් වේ දැයි සිතිය නොහැකි බව ද එබැවින් සුහදව සභාව කරගෙන යන ලෙස ද රටේ පවතින ප්‍රශ්නවලට විකල්පයක් නොමැති අතර, පෝලිම් යුගයක් පවතින බව ද 2022 වර්ෂය සියලුම දෙනාට සෞභාග්‍යමත් වසරක් වේවායි ප්‍රාර්ථනා කරන බව ද පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ්. විමලසිරි මැතිතුමා අදහස් දක්වමින් මෙම සභාව අද දින සාර්ථක සභාවක් වශයෙන් ගරු සභාපතිතුමන් හට සමබරව පවත්වාගෙන යාමට ශක්තිය ධෛර්යය ලැබීම පිළිබඳව සතුටට පත් වන බව ද විපක්ෂ කණ්ඩායම යම් යම් අවස්ථාවල දී ඉල්ලූ සියලු දේ ගරු සභාපතිතුමන් විසින් ලබා දුන් බවද සභාව නීත්‍යානුකූල නොමැති නම් මෙපමණ වේලාවක් සභා ගර්භය තුල කාලය නාස්ති කිරීම අපරාධයක් බව ද මේ වන විට රට පුරා පෝලිම් දක්නට ලැබෙන බව ද කසළ ඉවත් කිරීම, කාණු සුද්ධ කිරීම ආදී සේවාවන් අදින් පසුව සිදු නොකරන ලෙස පැවසූ අතර, මහජනතාවට සේවය කිරීමට පැමිණ මෙසේ සිදු කරන්නේ නම් මන්ත්‍රී ධූරනාව ගත නොහැකි බව ද පවසන ලදී.

එමෙන්ම කොරෝනා වසංගතය ඇති වූයේ මේ රටේ පමණක් නොවන බව ද අනිකුත් රටවල්වල කාබනික පොහොර වැනි විකල්පයන් සඳහා ගොස් කාලකණ්ණි තීරණ නොගත් බව ද එම තීරණවල ප්‍රතිඵල අද ලැබී ඇති බව ද ආණ්ඩුවෙහි පරස්පර විරෝධී තීරණ පවතින අතර, තව තවත් මෙම රට විනාශ නොකර රට පාලනය කිරීමට හැකි අයෙකුට බාර දෙන ලෙස ද පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය**

ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය අදහස් දක්වමින් 2022 වර්ෂය තුල එක වේලක් හෝ ආහාර ගෙන ජීවත් වන ලෙස ප්‍රාර්ථනා කරන අතර,ඉහළ පෙළේ නායකයින් විසින් ගනු ලැබූ අමන තීරණ

නිසා රටට මෙම තත්ත්වය ඇති වූ බව ද ව්‍යාපාරිකයන්ට පවා ව්‍යාපාර කටයුතු සිදු කිරීමට අමුද්‍රව්‍ය හිඟ වී ඇති බව ද ඉදිරි අනාගතයේ දරුවන් හට සිදු වන බලපෑම කුමක් වේදැයි සිතා ගත නොහැකි බව ද පක්ෂ පාට භේදයකින් තොරව සාමූහිකව එකතු වී මේ රට ගෙන යා යුතු අතර, අහිංසක ජනතාව ගැන සිතිය යුතු බව ද බළන්ගොඩ නගර සභාව තුළ මෙවැනිම ප්‍රශ්නයක් උද්ගත වී ඇති බව ද අයවැය සභා සම්මත වී මාසයක් පමණ ගත වී ඇති අතර අද වෙනත් දේ පවසන බව ද අවුරුදු 25-30 ක් සභාවේ සිටි මන්ත්‍රීවරුන්ට අවබෝධයක් නොමැති නම් නවක මන්ත්‍රීවරුන් හට මෙය ලොකු ප්‍රශ්නයක් බව ද ගරු ආණ්ඩුකාරතුමා, පළාත් පාලන කොමසාරිස්තුමා ඇතුළු ඉහළ පෙළේ නිළධාරීන් නිවැරදි පිළිතුරක් මේ වන තුරු ලබා දී නොමැති බව ද මෙම සිදුවීම් නිසා බළන්ගොඩ ජනතාව දුෂ්කරතාවයට පත්ව ඇති අතර, බළන්ගොඩ නගරයේ ජනතාව වෙනුවෙන් සේවය කිරීමට හැකි තත්ත්වයක් ලැබේවා යි ප්‍රාර්ථනා කරමින් 2022 වර්ෂය ජයවේවායි ප්‍රාර්ථනා කරන බව පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා අදහස් දක්වමින් ජනතාව අපහසුතාවයට පත්ව ඇති බව තමන් පිළිගන්නා අතර, ආණ්ඩුව විසින් ගත්තා වූ යම් යම් වැරදි තීරණ නිසා රට තුළ ජනතාවට විශාල පීඩනයක් ඇති වී ඇති බව ද මෙම ආණ්ඩුව විසින් යහපාලන ආණ්ඩුව ජනතාව මත පැන වූ වැට් බද්ද 15% සිට 7% දක්වා අඩු කරමින් විශාල රාජ්‍ය ආදායමක් අහිමි කර ගත් බව ද ඉන්පසු කොරෝනා වසංගතය හමුවේ දකුණු ආසියාවේ කිසිදු රටක් නොසිතූ ආකාරයට එන්නත්කරණයේ විශාල ජයග්‍රහණයක් ලබා ගත් අතර, තුන්වන මාත්‍රාව ලබා දුන් ලෝකයේ රටවල් 09 අතරින් 07 වන ස්ථානයට ශ්‍රී ලංකාව පත් ව ඇති බව ද ජන ජීවිතය ආරක්ෂා කිරීම සම්බන්ධව අතිගරු ජනාධිපතිතුමා ලොකු වගකීමක් ගෙන එය ඉෂ්ට කළ බව ද රටේ පවතින ජීවන බර හේතුවෙන් සෞඛ්‍යාරක්ෂිත බව ජනතාවට අමතක වී ඇති බවද එවැනි අර්බුදකාරී වාතාවරණයක් තුළ උපාධිධාරීන් 51000 කට ස්ථිර පත්වීම් ලබා දීම හා අ.පො.ස සාමාන්‍ය පෙළ අසමත් 35000 කට රැකියා ලබා දුන් බව ද අනියම් කොන්ත්‍රාත් පදනම මත බඳවා ගත් 8000 කගේ සේවය ස්ථිර කර ඇති බව ද පැවසීය.

එමෙන්ම පසුගිය යහපාලන කාලය තුළ විදුලි අර්බුදය විසඳීමට කිසිදු විකල්ප බලශක්තියක් යෝජනා නොකළ බව ද 2011 වර්ෂයේ අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමා නොරොච්චෝලේ විදුලි බලාගාරය ඉදි කිරීමෙන් පසු අද වන තුරු බලාගාරයක් ඉදි නොකළ බව ද 1970 වර්ෂයේ සිරිමාවෝ බණ්ඩාරණායක මැතිණියගේ පාලන කාලයේ මෙවැනිම විප්ලවයක් ආරම්භ වූ අතර, එතුමියට කිසිවෙකු සහයෝගය ලබා නොදුන් බව ද රටට සුහදායී ක්‍රියාදාමයක් ආරම්භ වන විට එයට සහයෝගය දිය යුතු වුව ද කඩාකප්පල් කිරීම සඳහා ජනතාව මහ පාරට බැස්සවීමට ප්‍රතිපක්ෂ ක්‍රියා කළ බව ද එයම අදත් සිදු කරන බව ද 1977 වර්ෂයේ මැතිවරණය පරාජය වීමේ දී රජය සතු කර්මාන්තශාලා 175 ක් තිබුණ නමුත් අද වෙද්දි විවෘත ආර්ථිකය හේතුවෙන් එම කර්මාන්තශාලා නොමැති බව ද ශ්‍රී ලංකාවේ කිසිම පාලකයෙක් අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා වගේ ප්‍රවේශයක් නොගත් බව ද කොරෝනා හේතුවෙන් එම ප්‍රවේශයට බාධාවක් ඇති වූ බව ද මෙම වර්ෂය තුළ යම් කිසි සාර්ථකත්වයක් ගැනීමට හැකි වනු ඇති බව ද ජනතාවගේ හැසිරීම හා දරා ගැනීම තුල සාර්ථකත්වය හා අසාර්ථකත්වය රඳා පවතින බව ද හොඳ වැඩපිළිවෙලක් පවතී නම් එය කඩාකප්පල් නොකර සාර්ථක කර ගැනීමට සහයෝගය ලබා දීමට වගකීමක් ඇති බව ද ගුරු වැටුප් වැඩි කරන ලෙස කල සාධාරණ ඉල්ලීම අනුව සාධාරණ විසඳුමක් ලබා දුන් බව ද රජයේ සේවකයන්ට රු.5000.00 ක දීමනාවක් ලබා දීම සිදු කරන නමුත් තමන්ගේ අදහස වන්නේ රටේ

උද්ධමනය පාලනය කිරීමට ක්‍රමවේදයක් සකස් කිරීම දීමනාව ලබා දීමට වඩා සුදුසු වන බව ද 2022 වර්ෂයේ අතිගරු ජනාධිපතිතුමාගේ වැඩ පිළිවෙල සාර්ථක වේවා යි ප්‍රාර්ථනා කරන බව ද පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා අදහස් දක්වමින් ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විපක්ෂයක් වශයෙන් තම පක්ෂය සහයෝගය ලබා නොදෙන බවට පැවසූ අතර, කොරෝනා කාල වකවානුවේදී රුපියල් 5000.00 දීමනාව ලබා දීමේ මුල් අවස්ථාවේ දී සහය දුන් නමුත් ඉන්පසුව ලබා දීමේ දී රහසිගතව ලබා දුන් බවද එන්නත්කරණයේ දී හිතවතුන්ට එන්නත් ලබා දුන් බව ද ගම්පෙරළිය හරහා යහපාලන ආණ්ඩුව තුළ විශාල සංවර්ධනයක් නගරයෙහි සිදු කළ අතර, ඔබතුමන්ලා සිදු කරන කර්මාන්තයන් සඳහා උපරිම සහයෝගය ලබා දෙන බව ද පක්ෂ භේදයකින් තොරව සියලුම දෙනා පාරට බැස රටේ පාලකයන්ට මේ වන විට මතු වී ඇති ගැටලු පැවසීමට සිදු වන බව ද එය පොදුවේ රටේම දරුවන්ගේ ප්‍රශ්නයක් බව ද කොරෝනා වෛරසයට එරෙහිව මුළු ලෝකයම එන්නත්කරණය සිදු කරන අවස්ථාවේ පැණිය දුන් රටක් බව ද ගරු සෞඛ්‍ය අමාත්‍යතුමිය දිස්ත්‍රික්කයේ සිටිද්දීත් මුට්ටි ගඟට දාපු පාලකයන් සිටින රටක් බව ද අතිගරු ජනාධිපතිතුමා සිදු කළ වැඩ පිළිවෙල වැරදි බව ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා පැවසුව අතර තමන් ද එය පවසන බව ද මිනිසුන්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීමට එකතු වන ලෙස ද බඩු මිල අඩු වී ජනතාවට ජීවත් වීමට සහන ලැබෙන සුබ නව වසරක් වේවායි ප්‍රාර්ථනා කරන බව ද පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.ඩබ්.පී. ගුණරත්න මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.ඩබ්.පී. ගුණරත්න මැතිතුමා අදහස් දක්වමින් නීත්‍යානුකූල සභාවක් නොවන නිසා අද දින කතා කිරීමට බලාපොරොත්තු නොවුන ද ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර කවිරත්න මැතිතුමා එන්නත්කරණය හොරෙන් සිදු කළ බවට කළ ප්‍රකාශය හේතුවෙන් එයට පිළිතුරු දීමට අපේක්ෂා කරන බව ද එන්නත්කරණයේ දී තමන් වසමේ මන්ත්‍රීවරයා වශයෙන් හොරෙන් එන්නත් ලබා නොදුන් අතර, ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර කවිරත්න මැතිතුමාට පවා උදව් කළ බව ද පැවසීය.

මෙහි දී ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර කවිරත්න මැතිතුමා පැවසූවේ ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.ඩබ්.පී. ගුණරත්න මැතිතුමාගේ සිත රිදුනේ නම් සමාවන ලෙසත්, තමන් පැවසූවේ ඇතැම් මන්ත්‍රීවරුන් ගැන බවත් ය.

**ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා අදහස් දක්වමින් නීත්‍යානුකූල සභාවක් නොවන නිසා අද දින කතා කිරීමට බලාපොරොත්තු නොවුන ද ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර කවිරත්න මැතිතුමා එන්නත්කරණය හොරෙන් සිදු කළ බවට කළ ප්‍රකාශය හේතුවෙන් එයට පිළිතුරු දීමට අපේක්ෂා කරන බව ද එන්නත් ලබා දීම හොරෙන් සිදු නොකරන අතර, බළන්ගොඩ නගර සභාව, බළන්ගොඩ ප්‍රාදේශීය

ලේකම් කාර්යාලය හා සෞඛ්‍ය වෛද්‍ය නිළධාරී කාර්යාලය අනුග්‍රහයෙන් කරන එන්නත් කිරීමේ ක්‍රමය ලෙස ප්‍රචාරක කටයුතු සිදු කරන බව ද රුපියල් 5000.00 දීමනාව ලබා දීමේ දී හැම දෙනෙකුටම ලබා දුන් අතර, දෙවන වර ලබා දුන්නේ ද පරණ ලැයිස්තුවටම බව ද රටේ ප්‍රශ්න ඇති වන විට පාරට බැස්සේ ඔබතුමන්ලා නොව ජනතා විමුක්ති පෙරමුණ බව ද එහි දී 88/89 වර්ෂවල ඝාතනය කර මර්දනය කළ බව ද අද වන විට උද්ඝෝෂණ පැවැත්වීමට ප්‍රජාතන්ත්‍රවාදී අයිතියක් ලබා දී තිබෙන බව ද කිසිදු ප්‍රහාරයක් එල්ල නොකළ බව ද මෙතෙක් ගෙන ආ යෝජනාවලට විරුද්ධ වූයේ මහජනතාවට විරුද්ධව නොව සභාව නීත්‍යානුකූල නොවන නිසා බව ද ගරු සභාපතිතුමා මෝඩයෝ, කුහකයෝ සිටින බව පවසන අතර, මෙවර එසේ නොකියන ලෙස ද ලැබුවා වූ නව වසර නිදුක් නීරෝගී සුබ නව වසරක් වේවායි ප්‍රාර්ථනා කරන බවද පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රිනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය**

ගරු නාගරික මන්ත්‍රිනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය අදහස් දක්වමින් අද දින නීත්‍යානුකූල නොවන සභාවක් බැවින් කතා කිරීමට නොසිටි නමුත් ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර කවිරත්න මැතිතුමාට පිළිතුරු ලබා දීමට අවශ්‍ය බව ද එන්නත්කරණය සම්බන්ධව තරුණ මන්ත්‍රීවරයෙකුට ප්‍රහාරයක් එල්ල කල බව ද බළන්ගොඩ නගර සභාවේ කිසිම අයෙකු ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමාට නරකක් නොකියන අතර, එතුමා විශාල කර්තව්‍යයක් සිදු කරන බැවින් ඒ වෙනුවෙන් ස්තුතිවන්ත විය යුතු බව ද එතුමා හොර රහසේ වැඩ නොකරන බව ද පක්ෂයක් වශයෙන් වෙන් නොකර 100% ක් එන්නත්කරණය සාර්ථක කර ගැනීමට පොදු ජන එක්සත් පෙරමුණු මන්ත්‍රීවරු බැඳී සිටිය බව ද එන්නත් අපට අවශ්‍ය අයට දෙන ලෙස කෙදිනකවත් නොකියූ අතර, නිළධාරීන් හමු වී අපෙන් විය යුත්තේ කුමක්දැයි විමසා කටයුතු කළ බව ද එසේ සිදු කිරීමට ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර කවිරත්න මැතිතුමාට ද හැකියාව තිබුණු බව ද පැල වර්ග බෙදීමේ දී පවා හොරෙන් එම දේවල් සිදු නොකළ බව ද ලැබුවා වූ නව වසර යස ඉසුරු පිරි සුබ නව වසරක් වේවා යි ප්‍රාර්ථනා කරන බව ද පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා අදහස් දක්වමින් පිරුණු කළේ දිය නොසැලේ යනුවෙන් ප්‍රකාශ කළ අතර, එන්නත්කරණය සිදු කිරීමේ දී ප්‍රාදේශීය සභා දෙක සහ බළන්ගොඩ නගර සභාවේ ගරු මන්ත්‍රීවරුන්, රජයේ නිළධාරීන් ආදී සියලුම දෙනාට විධිමත් පරිදි නියමිත එන්නත් ලබා දුන් බව ද පොඩි පොඩි දේවල් පවසමින් එන්නත්කරණය පිළිබඳව සභාවේ දී කතා කිරීම ගැන කණගාටුවට පත් වන බව ද ඇවිදින මංතීරුවේ වැඩ කටයුතු අවසන් බව ද උදේ 9.00 ට තුරු උයන ළඟ කන්ටේනර් මඟින් ලොරිවලට සිමෙන්ති පටවන බව ද සිමෙන්ති හිඟ වී ඇත්තේ ඉදිකිරීම් වැඩි වීම නිසා බව ද මුලින් හිඟයක් පැවතුණ ද මේ වන විට හිඟයක් නොමැති බව ද හිටපු නගරාධිපති විජය නිල්මිණී මැතිතුමාගේ භාර්යාවගේ අභාවය සම්බන්ධයෙන් ශෝකය පළ කරන බවද නීත්‍යානුකූල නොවන සභාවක් වුව ද උත්තර ලබා දීමට අවශ්‍ය නිසා නැගී සිටිය බව ද පැවසීය.

**ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී කේ.ජී. පේමදාස මැතිතුමා අදහස් දක්වමින් පක්ෂ විපක්ෂ හැමදෙනාම ආණ්ඩුව විවේචනය කරන බව ද ලැබී ඇති ආරංචි අනුව පාර්ලිමේන්තුව රැස්වන 18 වන දින ශ්‍රී ලංකා නිදහස් පක්ෂ ඇමැතිවරුන් ඉල්ලා අස්වීමේ සූදානමක් පවතින බව ද යම් කිසි දිනක දී මෙම රටට අවශ්‍ය කරන ඉන්ධන ගෙන්වා ගැනීමට නොහැකි වුවහොත් ජන ජීවිතය අඩාල වන බව ද විශාල භාණ්ඩ බහාලුම් ප්‍රමාණයක් වරායේ ඇති අතර, නිදහස් කර ගැනීමට ඩොලර් නොමැති බව ද ණය ශ්‍රේණිගත කිරීමේ විවිධ ආයතන පවතින බව ද එම ආයතනවලින් CCC ශ්‍රේණියේ සිට CC ශ්‍රේණිය දක්වා අප රට පහතට වැටී ඇති බව ද එසේ වූ පසු විදේශ ආයෝජන මෙම රටට නොලැබෙන අතර, විදේශ රටවලින් ණය ලබා නොදෙන බව ද ගරු මුදල් අමාත්‍යතුමා පසුගිය දිනක ඉන්දියාවේ ගොස් ණය ලබා ගැනීම පිළිබඳව සාකච්ඡා කළ බව ද ඉන්දියාව එහි දී පොරොන්දු වූ නමුත් ඔවුන් ලබා දෙන්නේ මුදල් නොව භාණ්ඩ බව ද එහි කොන්දේසි ඇතුලත්ව තිබිය හැකි බව ද මුස්ලිම් කොන්ග්‍රසය හා දෙමළ සන්ධානය ගනුදෙනු කරනු ලබන්නේ මෙම ආණ්ඩුව සමග නොව ඉන්දියාවත් සමඟ බව ද එම අයගේ විශාල ඉල්ලීමක් පළාත් සභා මැතිවරණය පවත්වන ලෙසට පවතින බවද රුපියල් බිලියන 90 ගණනක් අයවැයට පිටින් ගොස් රජයේ සේවකයන්, විශ්‍රාමික නිළධාරීන්ට හා ආබාධිතයන්ට ගෙවීමට තීරණයක් ගෙන ඇති බව ද ගුරු වැටුප් විෂමතාවය ඉවත් කිරීමට වෙන් කළ බිලියන 71 කට වඩා මෙය වැඩි බව ද මුදල් අච්චු ගසා ගෙවන බව ද මේ නිසා භාණ්ඩ මිළ ඉහළ යන බව ද ආහාර ද්‍රව්‍ය ඇතුළු භාණ්ඩ සඳහා පාලන මිලක් නොමැති අතර, හිතුමතේ විකුණන බව ද මේ නිසා සහල් මිල 200-250 ක් වශයෙන් වැඩි වීමකට ලක් විය හැකි බව ද පවසන ලදී.

එමෙන්ම ආණ්ඩුවේ මැති ඇමතිවරුන්ට විරුද්ධව විරෝධතා ඇති වී ඇති බව ද මේ ආකාරයෙන් දිගින් දිගටම මිනිසුන් හැසිරීමෙන් කුමක් වේදැයි සිතිය නොහැකි බව ද 1983 ජූලි කලබලය නිර්මාණය වී පක්ෂ 03 ක් තහනම් කළ අතර, එහි ප්‍රතිඵලය 1988/89 නිර්මාණය වීමට හේතු වූ බව ද ඇතැම් මන්ත්‍රීවරුන් කවුරු ආවත් කරන්න බෑ යැයි පැවසුව ද තම පක්ෂයට අවුරුදු 05ක් ලබා දුනහොත් මෙම රට ගොඩනැංවීමට හැකි බව ද රටේ පවතින අනවශ්‍ය වියදම් ඉවත් කරන බව ද පැවසීය.

මෙහි දී ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විමසා සිටියේ ජනතා විමුක්ති පෙරමුණ ආණ්ඩුව පැමිණියහොත් වෙනත් රටවලින් උදව් ලබා දෙයි ද යන්නයි.

මෙහි දී පිළිතුරු ලබා දුන් ගරු නාගරික මන්ත්‍රී කේ.ජී. පේමදාස මැතිතුමා, රටක් තවත් රටකට උදව් කරනු ලබන්නේ එහි නායකයන් කවුදැයි බලා නොවන බව ද 2005 -2017 අවසාන වනතුරු මහින්ද රාජපක්ෂ මැතිතුමා විශාල ණය ප්‍රමාණයක් ලබා ගෙන ඵලදායී නොවන කටයුතුවල යොදා ඇති බව ද තවත් අවුරුදු 10 කින් ප්‍රයෝජනවත් විය හැකි නමුදු ණය ගත් කාල සීමාව වැරදි බව ද මෙම ආණ්ඩුව ඇතුලත් ගිනි පිටත් ගිනි තත්ත්වයට පත්ව ඇති නිසා සමාජයේ ඇතිවන චලනයන් දෙස බලා ආණ්ඩුව විසුරුවා හැරිය හැකි බව ද සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශය අනුව කොම්පෝස්ට් ව්‍යාපෘතිය අවුරුදු 10 කින් සම්පූර්ණ කිරීමට බලාපොරොත්තු ලබා දී ඇති බව ද කොරෝනා හමුවේ වෙනත් රටවල ආදායම වර්ධනය වී ඇති නමුදු කාලයක් තිස්සේ පැවති මුදල් කළමනාකරණයේ අඩුපාඩු හේතුවෙන් අප රටට මෙම තත්ත්වය උදා වී ඇති බව ද පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා අදහස් දක්වමින් රසිකා මෙනවියගේ පියාගේ අභාවය පිළිබඳ ශෝකය පළ කරන ලදී.

**13. අවසානය**

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් අතීතය ගැන සිතා දුක්වෙන්නවත් වර්තමානය ගැන සිතා ආඩම්බර වෙන්නවත් අනාගතය ගැන බලාපොරොත්තු තියන් ජීවත්වන්නවත් එපා යැයි ද මේ මොහොතේ තිබෙන කටයුත්ත නිවැරදිව කිරීම ආදර්ශය විය යුතු බව ද අපාය හා දිව්‍යලෝකය ඇත්තේ මෙම මනුෂ්‍ය ලෝකයේම බව ද පැවසීය.

එමෙන්ම කොරෝනා ප්‍රශ්නයේ දී රජය විසින් එය තනියෙන් හිතුවක්කාර ලෙස සිදු කළ බව ද රටේ ව්‍යවස්ථාදායකයේ පක්ෂ කීපයක් නියෝජනය කරන නියෝජිතයන් සිටින අතර, එම නියෝජිතයන් නියෝජනය කරන විශාල පිරිසක් සිටින බව ද සර්ව පාර්ෂික සමුළුවක් මඟින් කළ යුතු කාර්යයක් තනිව සිදු කිරීම නිසා සාර්ථකයි යැයි පැවසුවත් අසාර්ථක බව ද අනිකුත් රටවල දළ දේශීය නිෂ්පාදනය, විදේශ සංචිත වර්ධනය කරගැනීම, කොරෝනා ආසාධිත සංඛ්‍යාව අඩු කර ගැනීම සිදු කරගෙන ඇතත් අපේ රට අනිකුත් රටවලට සාපේක්ෂව බලන විට අසාර්ථක බව ද අද රටේ ක්‍රියාත්මක කළ බහුතරයක් තීන්දු තීරණ අසාර්ථක බව ද එම නිසා රට අවුල් ජාලාවක කොටු වී ඇති බව ද සියලුම දෙනා එකතු වී වැටී ඇති අගාධයෙන් මිනිසුන් ගොඩ ගත යුතු අතර, අතිගරු ජනාධිපතිතුමා මොණරාගල දී කළ කතාවේ දී එතුමාගේ දර්ශනය සිදු කිරීමට රජයේ සිටින නිලධාරීන් මැති ඇමතිවරුන් ආදී සියලු දෙනා ඉඩ නොදෙන බව පැවසූ බව ද විද්‍යුත්, මුද්‍රිත හා දෘශ්‍ය මාධ්‍ය මඟින් එය දක්නට ලැබෙන අතර, එවැනි තත්ත්වයක් අද සභාවේ සිදු වී ඇති බව ද පවසන ලදී.

ගරු සභාපතිතුමා වැඩිදුරටත් අදහස් දක්වමින් සභාවේ කටයුතු නිසා බදු ගෙවන ජනතාව කබලෙන් ලිපට වැටී ඇති බව ද තමන්ව පාලනය කරන රජයෙන් ජනතාවගේ ජීවත්වීමේ පහසුව නැති කරන විට බළන්ගොඩ නගර සභාවෙන් ලබා දෙන සනීපාරක්ෂක සේවා ඇතුළු සේවා පහසුකම් නිසා යම්තාක් දුරකට රජයට එන ප්‍රශ්න අඩු කළ බව ද අද දින පවත්වන්නට යෙදුණු මහ සභාව කවුරුන් කෙසේ පැවසුවත් නීත්‍යානුකුල සභාවක් බව ද ලැබුවා වූ නව වසර සියලු ජනතාවට ජීවත් වීමේ ආසාව ඇති කරන, සාගින්දර දුක් ගින්දර නැති කරන බදු ගෙවන ජනතාවට සෞභාග්‍යමත් වන, සියලුම දේ මීට පෙර සිදු කළ ආකාරයෙන් කරගෙන යාමට අවශ්‍ය කරන ශක්තිය ධෛර්යය සභාවට ලැබෙන නව වසරක් වේවා යි ප්‍රාර්ථනා කරන බව ද රසිකා මෙනවියගේ පියාගේ අභාවය වෙනුවෙන් ගරු සභාවේ ශෝකය පළ කරන බව ද පවසමින් අද දින සභාවේ කටයුතු සාර්ථක කර ගැනීමට සහභාගි වූ ගරු මන්ත්‍රී මණ්ඩලය, ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලය හා මාධ්‍යවේදීන් සියලු දෙනාට ස්තුතිය පළ කරමින් මෙදින මහ සභාවේ වැඩ කටයුතු ප.ව.1.41 ට පමණ අවසන් කරන ලදී.

චමික ජයමිණී විමලසේන,
සභාපති,
බළන්ගොඩ නගර සභාව.